*සැ. යු.* - 2024.02.16 දින පළ කරන ලද අංක 2372 *ගැසට්* පත්‍රයේ III සහ IV (අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,373 - 2024 පෙබරවාරි මස 22 වැනි බ්‍රහස්පතින්දා - 2024.02.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 498 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 507 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 509 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 මාර්තු මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට්* පත්‍රයේ දැන්වීම් 2024 මාර්තු මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට්* පත්‍රය *www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - ගලගෙදර**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලදුව රාජසන්තක කරනු ලැබූ වාහන හා භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. මෙම අධිකරණය වෙත ඉදිරිපත් කරන ලදුව රාජසන්තක කරනු ලැබූ පහත උපලේඛනයේ දක්වා ඇති භාණ්ඩ **2024.03.02 වැනි දින පෙ.ව. 10.00** ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය මත වෙන්දේසිය පැවැත්වෙන දින **පෙ.ව. 8.30 - පෙ.ව. 9.30 දක්වා** වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

03. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේදී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

04. භාණ්ඩ මිල දී ගන්නා සෑම අයෙකු ම තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර, මිල දී ගන්නා සියලුම භාණ්ඩ එදින **ප.ව. 4.00** ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

05. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවේ අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය අධිකරණය සතු වේ.

06. භාණ්ඩ මිල දී ගැනීමට පැමිණෙන සෑම අයෙකුම නිසි සෞඛ්‍ය උපදෙස් අනුගමනය කළ යුතුය.

හර්ෂණ ධනුෂ්ක රත්නායක,
මහෙස්ත්‍රාත් අධිකරණය,
ගලගෙදර.

**භාණ්ඩ පිළිබඳ විස්තර**

| | *නඩු අංකය* | *භාණ්ඩය* |
|---|---|---|
| 01 | AR 2878/23<br>921/20<br>225/20 | උදලු -04 |
| 02 | 225/20 | සවල් - 03<br>තාච්චි - 01 |
| 03 | AR 2774/23 | පිත්තල කුකුළා පහන් - 01<br>(අඩි 2 අඟල් 9.2) |
| 04 | AR 2774/23 | පිත්තල බුලත් තට්ටු -01<br>(උස අඩි 2 අඟල් 9.2) |
| 05 | AR 2774/23 | පිත්තල මල් පෝච්චි -01<br>(අඟල් 10 උස) |
| 06 | 921/20 | යකඩ ඉණි - 02 |
| 07 | 9396/22 | සොලෙක්ස් වර්ගයේ වතුර මෝටරය |
| 08 | 9396/22 | අබලන් ටොයෝටා නම සඳහන් රිම් - 01 |
| 09 | 9396/22 | ඇලුමිනියම් තාච්චි - 03 |
| 10 | 601/20 | ඇලුමිනියම් - කෑන් 01 |

| | නඩු අංකය | භාණ්ඩය |
|---|---|---|
| 11 | 11522/23<br>11849/24<br>12098/24 | වැලි කියුබ් - 04 |
| 12 | අංක රහිත | යකඩ බැරල් කුඩා - 05<br>යකඩ බැරල් විශාල - 46 |
| 13 | අංක රහිත | ප්ලාස්ටික් බැරල් - 13 |
| 14 | අංක රහිත | ප්ලාස්ටික් කෑන් - කුඩා 50 |
| 15 | අංක රහිත | ප්ලාස්ටික් කෑන් - විශාල 50 |
| 16 | අංක රහිත | ඇලුමිනියම් මුට්ටි (ලොකු) - 01 |
| 17 | අංක රහිත | ඇලුමිනියම් මුට්ටි (පොඩි) - 01 |
| 18 | අංක රහිත | අබලන් ඇලුමිනියම් මුට්ටි සහ කොරහවල් (තොගයක්) |
| 19 | අංක රහිත | ප්ලාස්ටික් කල - 06 |
| 20 | අංක රහිත | ඇලුමිනියම් කල - 04 |
| 21 | අංක රහිත | වීදුරු බෝතල තොගයක් |

02 - 730

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - ආණමඩුව**

අධිකරණය වෙත ඉදිරිපත් කර ලද රාජසන්තක කරනු ලැබූ නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ආණමඩුව මහෙස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද නඩුවලට අදාළව මෙම අධිකරණය වෙත භාර දී ඇති රාජසන්තක කරන ලද නඩු භාණ්ඩ **2024 මාර්තු මස 13 වැනි බදාදා දින ප.ව. 12.30** ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳ හිමිකම් දක්වන්නේ නම් වෙන්දේසිය පවත්වන දිනයේ දී වෙන්දේසිය පැවැත්වීමට පැයකටවත් කලින් රෙජිස්ට්‍රාර්වරයා වෙත හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පෙර වෙන්දේසියේ විකිණීමට සූදානම් කර ඇති භාණ්ඩ පරීක්ෂා කළ හැක.

04. අධිකරණ විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ සඳහා එවලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර, චෙක්පත් මුදල් ඇණවුම් භාර ගනු නොලැබේ.

06. භාණ්ඩ මිල දී ගන්නා සෑම අයෙකු ම තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර, මිල දී ගන්නා සෑම භාණ්ඩයක් ම එදිනම **පස්වරු 4.00** ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කරගත යුතුය.

මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය - ආණමඩුව.

2024 පෙබරවාරි මස 13 වැනි දින,
ආණමඩුව මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01 | 40355/24 | අත් කියත් 01 යි<br>යත්ත 01 යි<br>නියන් 02 යි<br>අතකොළු 01 යි |
| 02 | 40206/24 | වක් පිහි 01 යි |
| 03 | 40170/24 | නිල් පැහැති 12.5 kg ප්‍රමාණයේ ගෑස් සිලින්ඩර් 01 යි |
| 04 | 06045 | නිල් පැහැති 12.5 kg ප්‍රමාණයේ ගෑස් සිලින්ඩර් 01 යි |
| 05 | 15328/18 | 12.5 kg ප්‍රමාණයේ ගෑස් සිලින්ඩර් 01 යි<br>ගෑස් ලිප් 01 යි |
| 06 | 18085/19 | 12.5 kg ප්‍රමාණයේ ගෑස් සිලින්ඩර් 01 යි<br>ගෑස් ලිප් 01 යි |
| 07 | 17024/19 | 12.5 kg ප්‍රමාණයේ ගෑස් සිලින්ඩර් 01 යි<br>12.5 kg ප්‍රමාණයේ ගෑස් සිලින්ඩර් 01 යි<br>ගෑස් ලිප් 01 යි<br>ගෑස් ලිප් 01 යි |
| 08 | 39938/24 | පාවහන් යුගල් 01 යි |
| 09 | 36991/23 | අංක රහිත සීෆෑන් වර්ගයේ අත් ට්‍රැක්ටරය (අබිලි ලෙස) |
| 10 | 38651/23 | අංක රහිත සීෆෑන් වර්ගයේ ටේලරය සමග අත් ට්‍රැක්ටරය (අබිලි ලෙස) |
| 11 | 54929/ඒ | TS - 8362 දරන යතුරු පැදිය (අබිලි ලෙස) |
| 12 | 21566/20 | BDW - 5165 දරන යතුරු පැදිය (සම්පූර්ණ ලෙස) |
| 13 | අංක රහිත | ලොකු කැන් 60 යි |
| 14 | අංක රහිත | පොඩි කැන් 100 යි |
| 15 | අංක රහිත | ප්ලාස්ටික් කල ගෙඩි 05 යි |
| 16 | අංක රහිත | වීදුරු බෝතල් 500 යි |
| 17 | අංක රහිත | ප්ලාස්ටික් බැරල් 02 යි |
| 18 | අංක රහිත | යකඩ බැරල් 15 යි |



**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මාතලේ**

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ
ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මාතලේ මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරනු ලැබූ පහත සඳහන් භාණ්ඩයන් හා වෙන්දේසි කිරීම සඳහා නිර්දේශිත භාණ්ඩ **2024.03.09 වැනි සෙනසුරාදා දින පෙ.ව. 10.00** ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳව කිසිවෙකු අයිතිවාසිකම් දක්වන්නේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින හෝ ඊට පෙර මෙම අධිකරණය වෙත ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩය පරීක්ෂා කර බැලිය හැකිය.

අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවක දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩයන් එම අවස්ථාවේ දීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු වන අතර චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

වෙන්දේසියෙන් භාණ්ඩ මිල දී ගැනීමට පැමිණෙන තැනැත්තන් අනිවාර්යයෙන් ම තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

ආර්. ජී. එන්. කේ. රංකොත්ගේ,
අතිරේක මහෙස්ත්‍රාත් - මාතලේ.

2024 පෙබරවාරි මස 12 වැනි දින,
මාතෙලේ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

I කාණ්ඩය

| අනු අංකය | නඩු අංකය | විස්තරය |
|---|---|---|
| 01 | 7399 | බාල්දිය |
| 02 | 87392 | විදුලි පන්දම |
| 03 | 87031 | LED බල්බයක් |
| 04 | 87248 | 2000 ml හිස් සුදු පාට බාල්දි 01 |
| 05 | 87244 | බැරලය |

| අනු අංකය | නඩු අංකය | විස්තරය |
|---|---|---|
| 06 | 87207 | බැරලය |
| 07 | 86838 | වීදුරු කෝප්ප 01 |
| 08 | AR 2155/23 | බැටරිය |
| 09 | 86660 | ළමා ටී ෂර්ට් 01 |
| 10 | 88028 | උදලු 01/ වේවැල් කුඩ 01 යි |
| 11 | 88029 | බාල්දි 01/ වේවැල් කුඩ 01 යි |
| 12 | 86657 | Power Steering Fuel Oil කෑන් 01 |
| 13 | 86373 | ප්ලාස්ටික් කළය 01 |
| 14 | 86653 | රෙදි යාරයක් අඩංගු පාර්සලය |
| 15 | 88299 | දුරකථන චාජර් 01 ක් |
| 16 | 88071 | ටී ෂර්ට් 01 |
| 17 | 87384 | පාපිසි 01 |
| 18 | 88548 | ඇලුමිනියම් කළ ගෙඩි |
| 19 | B 468/18 | මෝටර් සයිකල් (JZ 6821) |
| 20 | AR 1702/22 | මෝටර් සයිකල් (BGP 3579) |
| 21 | AR 1126/23 | මෝටර් සයිකල් (XK 4708) |
| 22 | 85284 | යුනිමෝ වර්ගයේ අත් ට්‍රැක්ටරය (අබිලි ද්‍රව්‍ය සඳහා) |
| 23 | 88818 | සවල් 02 |

II කාණ්ඩය

| | | |
|---|---|---|
| 25 | 88682 | පස් |
| 26 | 88683 | පස් |

III කාණ්ඩය

| අනු අංකය | ඇල්බමයේ සඳහන් අංකය | නඩු අංකය | විස්තරය |
|---|---|---|---|
| 01 | 23 | අංක රහිත | අලවංගු 01 |
| 02 | 24 | අංක රහිත | අත් ආවරණ 01 (ග්ලවුස්) |
| 03 | 25 | අංක රහිත | කියත් 01 |
| 04 | 26 | අංක රහිත | ලී මිටි 01 |
| 05 | 27 | අංක රහිත | බාල්දි 01 |
| 06 | 28 | අංක රහිත | මුට්ටිය 01 |
| 07 | 29 | අංක රහිත | කේබල් රෝල් 01 |
| 08 | 30 | අංක රහිත | රතු පාට ප්ලාස්ටික් බාස්කට් 01 |
| 09 | 31 | අංක රහිත | ප්ලාස්ටික් පුනීල 01 |
| 10 | 32 | අංක රහිත | වයර් රෝල් 01 |
| 11 | 33 | අංක රහිත | නිල් පාට ප්ලාස්ටික් බාස්කට් 01 |
| 12 | 34 | අංක රහිත | ඇලුමිනිම් කල 01 |
| 13 | 35 | අංක රහිත | ප්ලාස්ටික් පුටු 01 |
| 14 | 36 | අංක රහිත | වයර් රෝල් 01 |
| 15 | 37 | අංක රහිත | අලවංගු 01 |
| 16 | 38 | අංක රහිත | සවල |
| 17 | 39 | අංක රහිත | වයර් රෝල |
| 18 | 40 | අංක රහිත | වතුර මෝටරය |

02 - 758

---

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මහව**

මෙම අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් කියන්නන් ඉදිරිපත් නොවූ සහ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය මගින් වෙන්දේසි කිරීම සඳහා නිර්දේශිත භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. මහව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද පහත උපලේඛනයේ සඳහන් නඩු භාණ්ඩ **2024.03.16 වැනි දින පෙ.ව. 10.00** ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙහි පහත සඳහන්වන නඩු භාණ්ඩ පිළිබඳ හිමිකම් පාන්නෙකු සිටී නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු වේ.

03. උපලේඛනයේ සඳහන් නඩු භාණ්ඩ අධිකරණ රෙජිස්ට්‍රාර් වරයාගේ අවසරය මත එදින වෙන්දේසිය පැවැත්වීමට පැය භාගයකට ප්‍රථම ගැණුම්කරුවන්ට පරීක්ෂා කළ හැකිය.

04. අධිකරණ විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිග න්නා අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුවේ.

05. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේදීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, සියලුම ගෙවීම් මුදලින් පමණක් සිදු කළ යුතු අතර, මුදල් ඇණවුම් හෝ චෙක්පත් භාර ගනු නොලැබේ.

06. වෙන්දේසියේ භාණ්ඩ මිල දී ගැනීමට පැමිණෙන ගැණුම්කරුවන් තම අනන්‍යතාවය තහවුරු කිරීමට ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

ඩබ්. එම්. නුවන් ප්‍රියනීල් ගුණසේකර,
දිසා විනිසුරු - මහව.

2024 පෙබරවාරි මස 13 වැනි දින,
මහව දිසා අධිකරණයේ දී ය.

*උපලේඛනය*

*වෙන්දේසියට අදාළ භාණ්ඩ ලැයිස්තුව*

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | 18054 | NW PU 6122 අංක දරන මහින්ද්‍රා වර්ගයේ ලොරි රථය | 01 |
| 02 | 24182/F | NW BCU 2151 අංක දරන 135 හීරෝ යතුරු පැදිය | 01 |
| 03 | 99109/F | අංකය අපැහැදිලි ටේලරය (අබලි) | 01 |
| 04 | 14263/E | බජාජ් අංක තහඩු නොමැති ප්ලැටිනා 100 යතුරු පැදිය | 01 |
| 05 | 04834/PC | 64 - 3581 අංක දරන මිට්සුබිෂි පෙජරෝ රථය (අබලි) | 01 |
| 06 | 26457/E | NC UP - 0013 අංක දරන බොස් 1/2 වර්ගයේ ඉදිරි ලාම්පුව කැඩී ගිය ස්විච් යතුර නොමැති යතුරු පැදිය (අබලි) | 01 |
| 07 | AR 1182/23 | 139 - 0248 අංක දරන යමහා යතුරු පැදිය (අබලි) | 01 |
| 08 | 91062 | NW HB 1330 අංක දරන අත් ට්‍රැක්ටරය | 01 |
| 09 | 03442/E | NW BCP 9668 බජාජ් ප්ලැටිනා යතුරු පැදිය | 01 |
| 10 | 12699 | NW RW 7059 ටේලරය (අබලි)<br>NW PC 9774 අත් ට්‍රැක්ටරය (අබලි) | 01 |
| 11 | 34S26 | SP WG 1517 බජාජ් ඩිස්කවරි යතුරු පැදිය (අබලි) | 01 |
| 12 | 28281 | අංකය නොමැති අත් ට්‍රැක්ටරය (අබලි) | 01 |
| 13 | 20355/19 | NW GB 8342 හොන්ඩා යතුර පැදිය | 01 |
| 14 | 23656/20 | NC BAE 6067 බජාජ් CT 100 යතුරු පැදිය | 01 |
| 15 | 96779 | NW PS 7976 මහෙන්ද්‍රා මැක්සිමෝ ලොරි රථය | 01 |
| 16 | 37851 | අංක නොමැති යන්මාර් අත් ට්‍රැක්ටර් එන්ජිම (අබලි) | 01 |
| 17 | අංක රහිත | NW LB 9740 ස්වරෙඩ් මැස්ඩා වර්ගයේ ලොරි රථය | 01 |
| 18 | අංක රහිත | රවුම් බෝතල් | 500 |
| 19 | අංක රහිත | හතරැස් බෝතල් | 500 |

02 - 759

## මහෙස්ත්‍රාත් අධිකරණය - මුතූර්

මුතූර් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - 2024.03.02

01. මුතූර් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද පහත සඳහන් නඩු භාණ්ඩ **2024.03.02** වන දින **පෙ.ව. 9.00** ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කිරීමට හැකි වේ.

03. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසුව නොපිළිගන්නා ලද අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතු වේ.

04. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේ දී මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර සියලුම ගෙවීම් මුදල්වලින් පමණක් කළ යුතුය.

05. වෙන්දේසියෙන් භාණ්ඩ මිල දී ගැනීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කළ යුතුය.

තස්නිම් මොහොමඩ් ෆවුසාන්,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මුතූර්.

**උපලේඛනය**

| අනු. අංකය | ලියාපදිංචි අංකය | භාණ්ඩ | අයිතම ගණන |
|---|---|---|---|
| 01 | AR/904/23 | Fishing net (මාළු දැල්) | 01 |
| 02 | AR/905/23 | Fishing net (මාළු දැල්) | 01 |
| 03 | AR/775/23 | Fiber boat (ෆයිබර් බෝට්ටු) | 02 |
| 04 | - | Oxygen Cylinders (ඔක්සිජන් සිලින්ඩර්ස්) | 05 |
| 05 | - | River sand (වැලි) | කියුබ් 06 |
| 06 | - | Soil (පස්) | කියුබ් 06 |
| 07 | - | Empty big size barrels හිස් බැරල් (ලොකු) | 38 |
| 08 | - | Empty small size barrels හිස් බැරල් (පොඩි) | 14 |
| 09 | - | Damage iron cupboard / අබලන් යකඩ අල්මාරි | 01 |
| 10 | - | Barbed fence wire rolls / කටු කම්බි රෝල් | 09 |
| 11 | - | Damaged red colour motors trycicle chassis & Body frame (iron weight) (අබලන් වූ රතු පැහැති ත්‍රීවීල් රථයේ චැසි) | 01 |
| 12 | MC/42626/19 | Blue colour canoe / නිල් පැහැති ඔරුව | 01 |
| 13 | - | Floats (ඉපිලි) | 1000 |
| 14 | - | White colour floats (සුදු පැහැති ඉපිලි) | 85 |
| 15 | - | Nylone ropes set (නයිලෝන් ලණු) | 20 |
| 16 | - | coppers coils rolls (තඹ කම්බි දඟර) | 04 |

02 - 761

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - හිඟුරක්ගොඩ

අධිකරණයට ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. හිඟුරක්ගොඩ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද සහ කල්තබා ගැනීමේදී විනාශ වී යා හැකි භාණ්ඩ **2024.03.16** වැනි දින **පෙ.ව. 09.30** ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු වේ නම්, වෙන්දේසිය පවත්වනු ලබන දින, වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳව සලකා බැලීම සඳහා අදාළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්තුමියගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1 1/2 කට පෙර වෙන්දේසියට නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසුව නොපිළිගන්නා අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ භාර ගැනීමේ දී හා මුදල් ගෙවීමේ දී තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර, භාණ්ඩ මිල දී ගැනීමට එන සෑම අයකුම ජාතික හැඳුනුම්පත රැගෙන ඒම අනිවාර්ය වේ.

06. භාණ්ඩ මිල දී ගැනීම මුදලින් කළ යුතු අතර, මිල දී ගන්නා ලද භාණ්ඩ වෙන්දේසිය පවත්වනු ලබන දිනයේ දී **ප.ව. 4.00** ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

සුභානි අබේසේකර,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
හිඟුරක්ගොඩ.

2024 පෙබරවාරි මස 14 වැනි දින,
හිඟුරක්ගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ වර්ගය* |
|---|---|---|
| 01 | 97907 | ඉලෙක්ට්‍රොනික් තරාදි 01 |
| 02 | 97908 | ඉලෙක්ට්‍රොනික් තරාදි 01 |
| 03 | 94281 | ඉලෙක්ට්‍රොනික් තරාදි 01 |
| 04 | 74008 | විදුලි පන්දම් 01<br>පිහි 01 |
| 05 | 80285 | තහඩු බාල්දි 01 |
| 06 | 67515 | යකඩ බාල්දි 01<br>උදලු 01 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ වර්ගය |
|---|---|---|
| 07 | 99642 | අත් කියත් 01<br>මුළු මට්ටම් 01<br>අඬු මිටි 01 |
| 08 | 56540 | ෆයිබර් ඔරුව සහ කොල්ලෑව |
| 09 | 86894 | මොප් 01 |
| 10 | AR 625/23 | ඇලුමිනියම් හට්ටි 01<br>ඇලුමිනියම් මුට්ටි 01<br>ඉටිරෙදි පාර්සල් 01<br>හිස් කෑන් 02 |
| 11 | 93989 | ප්ලාස්ටික් පැදුරු 01 |
| 12 | 29698 | තරාදි 01 |
| 13 | 27682 | කැති 01 |
| 14 | 68217 | වතුර මෝටරයේ කොටස් 01<br>වතුර බට 02 |
| 15 | 94969 | උදලු 01<br>යකඩ බාල්දි 01<br>ප්ලාස්ටික් බාල්දි 01<br>යකඩ මිටි 01 |
| 16 | 88105 | පිහි 02<br>තරාදි 01 |
| 17 | 88175 | පොරව 01 |
| 18 | 80874 | සවල් 01 |
| 19 | 87467 | කැති 01 |
| 20 | 80777 | කියත් 01 |
| 21 | 90852 | උදලු 01<br>මිටි 01 |
| 22 | 90874 | පොරව 01<br>මිනුම් පටි 01<br>ඉස්කුරුප්පු නියන් 05<br>යතුරු 04<br>පීරි 02 |
| 23 | 74263 | විදුලි පන්දම් 01<br>පිහි 01 |
| 24 | 74262 | විදුලි පන්දම් 01<br>පිහි 01 |
| 25 | 98796 | පිහි 01 |
| 26 | අංක රහිත | හිස් බූලි තොගයක් |
| 27 | අංක රහිත | හිස් බෝතල් තොගයක් |
| 28 | අංක රහිත | හිස් බැරල් තොගයක් |
| 29 | අංක රහිත | පස් කියුබ් 10 |

02 - 790

## මහෙස්ත්‍රාත් අධිකරණය - ගල්ගමුව

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ නඩු භාණ්ඩ
ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගල්ගමුව මහෙස්ත්‍රාත් අධිකරණයෙන් රාජසන්තක කරන ලද පහත උපලේඛනයේ දැක්වෙන නඩු භාණ්ඩ **2024.03.02 වන සෙනසුරාදා දින පෙ.ව. 10.00** ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි උපලේඛනය සඳහන් වන භාණ්ඩ පිළිබඳ අයිතිවාසිකම් කියන්නකු සිටීනම් වෙන්දේසිය පැවැත්වෙන දින **පෙරවරු 09.30** ට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

02. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂාකර බැලිය හැකිය.

03. වෙන්දේසියේ දී මිල දී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවිය යුතු අතර, **ප.ව. 4.00** ට පෙර අදාළ භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් පමණක් සිදු කළ යුතු අතර චෙක්පත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ.

04. වෙන්දේසියේ දී භාණ්ඩ මිල දී ගනු ලබන අය තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

05. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවක දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

06. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම් වෙන්දේසියේ කටයුතු අවසන් කිරීමට පෙර ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

එන්. පටබැඳිගේ,
මහෙස්ත්‍රාත් - ගල්ගමුව,

2024 පෙබරවාරි මස 15 වැනි දින,
ගල්ගමුව මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### උපලේඛනය

වෙන්දේසියට අදාළ භාණ්ඩ ලැයිස්තුව

| *අනු. අංකය* | *නඩු අංකය* | *දේ. කු. අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|---|
| 01 | AR 220/24 | 1160/23 | මවුන්ටන් වර්ගයේ පාපැදිය |
| 02 A<br>B | 45338 | 63/24 | 12.5 kg ගෑස් සිලින්ඩරය<br>ගෑස් ලිපක් |
| 03 | 44978 | - | යතුරු පැදි ආරක්ෂිත හිස් වැසුම් 01 |
| 04 | 44981 | - | යතුරු පැදි ආරක්ෂිත හිස් වැසුම් 01 |
| 05 | 45749 | - | Delss වර්ගයේ යතුරු පැදි ආරක්ෂිත හිස් වැසුම් එකයි |
| 06 | 43182 | - | ORANGE 40A ISOLATOR 02 යි |
| 07 | 43057 | - | KEVILTON BREAKER 04 යි |
| 08 | 44987 | - | මල්ටි සොකට් 08 යි |
| 09 | 44983 | - | MORTEIN වේෆරයිසර් 35 ml මැෂින් 02යි |
| 10 | - | - | බූලි - ලීටර් 25 |

| අනු. අංකය | නඩු අංකය | දේ. කු. අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|---|
| 11 | - | - | කුඩා කෑන් |
| 12 | - | - | වීදුරු බෝතල් (මිශ්‍ර) |
| 13 | - | - | ලීටර් 200 ලොකු බැරල් |
| 14 | - | - | ලීටර් 20 කුඩා බැරල් |
| 15 | - | - | ලීටර් 200 ප්ලාස්ටික් ලොකු බැරල් |
| 16 | - | - | ලීටර් 75 ප්ලාස්ටික් කුඩා බැරල් |

02 - 832

# රජයේ නොවන දැන්වීම්

## ගණන් බේරා වසා දැමීමේ ආඥාව සහ ඈවරකරු පත්කිරීම පිළිබඳ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනත

| | | |
|---|---|---|
| සමාගමේ ලියාපදිංචි අංකය | : | පීවී 12726 |
| සමාගමේ නම | : | සීවලී කර්මාන්තායතනය (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය | : | 24/1, නම්බපාන පාර, හංවැල්ල. |
| අධිකරණය | : | බස්නාහිර පළාත්බද වාණිජ මහාධිකරණය |
| නඩු අංකය | : | සීඑච්සී/48/2011/සීඕ |
| ඈවර කිරීමේ ආඥාව නිකුත්කළ දිනය | : | 2013.07.24 |
| පෙත්සම ඉදිරිපත්කළ දිනය | : | 2011.10.07 |
| ඈවරකරු පත්කළ දිනය | : | 2019.01.28 |
| ඈවරකරුගේ නම | : | ජනක විජයන්ත රිටිගහපොල |
| ලිපිනය | : | අංක 35 බී, හමංගොඩ, කටුගස්තොට. |

02 - 760

---

## අයික්‍යුවියා සොලුෂන්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සහ කුවින්ටයිල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම් ඒකාබද්ධ කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 241 (4) (b) වගන්තිය ප්‍රකාර නිවේදනයයි

අයික්‍යුවියා සොලුෂන්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් අංකය : PV 3165) සහ කුවින්ටයිල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් අංකය : PV 77874) යන සමාගම් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 අංක 7 දරන සමාගම් පනතේ 239 වෙනි වගන්තිය ප්‍රකාරව, අයික්‍යුවියා සොලුෂන්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සහ කුවින්ටයිල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම් ඒකාබද්ධ කර එක් අස්ථිත්වයක් බවට පත්කරනු ලබන බවත් එයින් පසු එම සමාගම් අයික්‍යුවියා සොලුෂන්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් වන බවටත් යෝජනා කොට ඇත.

ඒකාබද්ධ කරනු ලබන අයික්‍යුවියා සොලුෂන්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සහ කුවින්ටයිල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමගම්වල යම් කොටස්කරුවෙකු හෝ ණයහිමියකු හෝ ඒකාබද්ධ කරනු ලබන සමාගමක බැඳීමක් ඇති යම් අයෙකුට ඒකාබද්ධ කරුණු ලබන සමාගම්

වල ලියාපදිංචි කාර්යාලයන්හි එම සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලයන් විසින් අනුමත කරන ලද ඒකාබද්ධ කිරීම සඳහා යෝජනාවේ පිටපත් පරීක්ෂාකර බැලීම සඳහා තබා ඇති අතර, ඒකාබද්ධ කරනු ලබන සමාගම්වල යම් යම් කොටස්කරුවෙකු හෝ ණයහිමියෙකු හෝ ඒකාබද්ධ කරනු ලබන සමාගමක බැඳීමක් ඇති යම් අයෙකුට ඒකාබද්ධ කරනු ලබන සමාගමක් වෙත ඉල්ලීමක් කිරීමෙන් ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපතක් කිසිදු ගෙවීමකින් තොරව ලබා ගැනීම සඟා හිමිකමක් ඇත.

මෙම ඒකාබද්ධ කිරීම 2024 මාර්තු මස 01 දින ක්‍රියාත්මක වීමට නියමිතයි.

මැනේජර්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

කුවින්ටයිල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්.

02 - 765

---

## සමාගමක නම වෙනස් කිරීම පිළිබඳව දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වගන්තිය අනුව 2024 ජනවාරි 29 දින සිට බලපැවැත්වෙන පරිදි සමාගමේ නම වෙනස් කර ඇති බව (8 වන වගන්තියට අනුව) මහජනතාව වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

| | | |
|---|---|---|
| සමාගමේ මුල් නාමය | : | සන්ෆ්ලවර් ඉම්පෝර්ට් ඇන්ඩ් එක්ස්පෝර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සමාගමේ අංකය | : | PV 122694 |
| ලිපිනය | : | අංක 193/4, මිහිර මාවත,<br>පලිගෙදර, පිළියන්දල. |
| සමාගමේ නව නාමය | : | බ්‍රැන්ඩ්ස් ඇන්ඩ් ට්‍රෙන්ඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |

එස්ජේ කෝර්පරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

අංක 20/ඒ, වල්පොල පාර,
අග්ගොන, අංගොඩ.

02 - 767

---

## 2007 අංක 7 දරන සමාගම් පනතේ 244(3) වන වගන්තිය ප්‍රකාරව සමාගම් ඒකාබද්ධ කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි

### සිංගර් බිස්නස් ස්කූල් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ඩොමුස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම් සිංගර් (ශ්‍රී ලංකා) පීඑල්සී සමාගම සමග ඒකාබද්ධ කිරීම

සිංගර් බිස්නස් ස්කූල් (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් අංකය : PV 105/194) සහ ඩොමුස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගමේ අංකය : PV 128617) යන සමාගම් සිංගර් (ශ්‍රී ලංකා) පීඑල්සී (සමාගම් අංකය : PQ 160) සමාගම සමග ඒකාබද්ධ කරන ලද බව හා 2007 අංක 07 දරන සමාගම් පනතේ 244 (1) (අ) වගන්තිය ප්‍රකාරව 2024 ජනවාරි 22 දින දරන සමාගම් ඒකාබද්ධ කිරීමේ සහතිකය සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 244(3) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2007 අංක 07 දරන සමාගම් පනතේ 244(2) වගන්තිය ප්‍රකාර ඒකාබද්ධ කිරීම 2024 ජනවාරි මස 01 වැනි දින සිට බලාත්මකවන අතර ඉහත සඳහන් ඒකාබද්ධ කරන ලද සමාගම් 2024 ජනවාරි මස 01 වැනි දින සිට සිංගර් (ශ්‍රී ලංකා) පීඑල්සී යන නමින් පවත්වාගෙන යනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලයන්හි නියමය පරිදි,

හේලීස් ගෲප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරුන්.

2024 පෙබරවාරි මස 13 වැනි දින.
අංක 400, ඩීන්ස් පාර,
කොළඹ 10.

02 - 775

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

ඩබ්ලිව්. එම්. පී. එස්. රණසිංහ සහ එල්. ඩී. අයි. පෙරේරා.
ගිණුම් අංක : 0188 5000 3404

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2023.02.23 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දෙකෝටි හාර ලක්ෂ අනූ හය දහස් හත්සිය හතලිස් හයයි ශත හැට අටක (රු. 20,496,746.68) මුදල ද, 2023 පෙබරවාරි මස 02 දින සිට අංක 343 සහ 787 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි අනූ ලක්ෂයක (රු. 19,000,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වේනොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2023.04.28 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2023.04.20 දින සහ ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි,

**2024.04.02 වැනි දින පෙ.ව. 11.00 ට**

පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන්වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මැද්දේ මැදිලිය පත්තුවේ, කිනිගොඩ කෝරළේ, රඹුක්කන ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ රඹුක්කන ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ හුරිමලුව අංක 8B දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මොට්ටප්පුලිය ග්‍රාමයේ පිහිටි "වඩියකනත්තේ කෝන්ගහමුලහේන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. එම්. ආර්. ටී. කේ. හේරත් යන අය විසින් සාදන ලද 2015 සැප්තැම්බර් මස 02 දින හා අංක 264/2015 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක 12/88 දරන පිඹුරේ ලොට් 02 සහ 03, නැගෙනහිරට : අංක 1625 දරන පිඹුරේ ලොට් 02, දකුණට : නිවාසවල සිට ප්‍රධාන පාර දක්වා දිවෙන පාර (ප්‍රාදේශීය සභා) සහ බස්නාහිරට: මස්කඩේවත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි තුනක් (P:23) හෝ හෙක්ටයාර 0.058ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 264/2015 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 1 වඩා නිවැරදි ව පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මැද්දේ මැදිලිය පත්තුවේ, කිනිගොඩ කෝරළේ, රඹුක්කන ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ රඹුක්කන ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ හුරිමලුව අංක 8B දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මොට්ටප්පුලිය ග්‍රාමයේ පිහිටි "වඩියකනත්තේ කෝන්ගහමුලහේන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. රත්නායක යන අය විසින් සාදන ලද 1993 ජුනි 27 දාතම හා අංක 1625 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : බලයලත් මානක තැන එස්. ආර්. පී. එල්. සේනානායක යන අය විසින් සාදන ලද අංක 12/88 දරන පිඹුරේ ලොට් 02 සහ 03, නැගෙනහිරට : අශෝකා ක්‍රීඩාංගනයට දිවෙන පාර, දකුණට : අශෝකා ක්‍රීඩාපිටිය වෙන්කෙරෙන කම්බි වැට සහ පැලඉණි වැට සහ බස්නාහිරට: මස්කඩේවත්ත වෙන්කෙරෙන කම්බි වැට සහ පැලඉණි වැට යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි තුනක් (P:23) හෝ හෙක්ටයාර 0.058ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1625 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව G 115/116 යටතේ කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

02 - 827

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

ඩී. ජී. එස්. කරුණාතිලක
ගිණුම් අංක : 1214 8100 2398

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2023.02.23 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව 2024 පෙබරවාරි 06 වැනි දිනට ලැබිය යුතු සහ අයවිය යුතු රුපියල් එක් කෝටි පනස් හත් ලක්ෂ විසි අට දහස් එකසිය අනූ එකයි ශත හැට හයක (රු. 15,728,191.66) දූන් අඩු කරන ලද මුදල ද, 2024 පෙබරවාරි 07 දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැත්තෑ දහස් හයසිය හතළිස් පහයි ශත විසි එකක (රු. 70,645.21) මුදලක් සඳහා වාර්ෂිකව සියයට නවයක් (9%) හා තවත් රුපියල් එක් කෝටි විසි හත් ලක්ෂ අනූ පන් දහස් හයසිය හැට තුනයි ශත හතළිස් තුනක (රු. 12,795,663.43) මුදලක් සඳහා වාර්ෂිකව සියයට අටක් (8%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2023.04.06 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2023.04.06 දින සහ ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි,

**2024.04.03 වැනි දින ප.ව. 01.00 ට**

පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ හෝකන්දර උතුර අංක 494 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හෝකන්දර උතුර පිහිටි මාලබේ පාර වරිපනම් අංක 06 දරන "දෙල්ගහවත්ත"යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී ඩබ්ලිව් අබේසිංහ යන අය විසින් සාදන ලද 1985 ජනවාරි 06 දාතම හා අංක 1663 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : පන්සල් වත්ත නැගෙනහිරට : මෙම ඉඩමේ කොටසක් දකුණට : ඩබ්ලිව් පත්බේරිය විසින් හිමිකම් කියන කුඹුර සහ බස්නාහිරට : ලොට් 1 සහ පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිහක් (පර්.30) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1663 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව B 1290/140 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

02 - 826

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

ඩී. ඒ. සමරසේකර
ගිණුම් අංකය : 0074 5000 6496

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2023.10.26 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දෙකෝටි හය ලක්ෂ හැට පන් දහස් නමසිය තිස් හතරයි ශත හැත්තෑවක (රු. 20,665,934.70) මුදල ද, 2023.08.21 දින සිට අංක 2772 උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි දහ හතර ලක්ෂ අසූ අට දහස් තිස් නමයයි ශත අනූ පහක (රු. 11,488,039.95) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) හා තවත් රුපියල් හැට ලක්ෂ පනස් තුන් දහස් නමසිය තිස් හයයි ශත හැත්තෑ තුනක (රු. 6,053,936.73) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහයි දශම අටක් (5.8%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2023.12.29 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2023.12.21 දින සහ ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි,

**2024.04.04 වැනි දින පෙ.ව. 11.00 ට**

පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

## උපලේඛනය

ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල වැදිරට කෝරළේ, මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ විහාරමුල්ල 126/F ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මුප්පනේ ග්‍රාමයේ පිහිටි "වැවඅරාවහේන *නොහොත්* වැවඅරාව" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. එම්. ඩබ්ලිව්. බී. දිසානායක යන අය විසින් සාදන ලද 2017 නොවැම්බර් 07 දාතම හා අංක 4021 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරටः ලොට් 2 සහ පාර සඳහා වෙන්කිරීම (මහපාර), නැගෙනහිරට : ලොට් $55^{BC}$, දකුණට : ලොට් $55^{BC}$ සහ ලොට් 2 සහ බස්නාහිරටः ලොට් 2 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකක් (රූඩ්.1) හෝ හෙක්ටයාර 0.1012ක් විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග වැදි කුඹුර පාර (දකුණ), වරිපනම් අංක 74, 74/1 දරන පරිශ්‍රයන්ද සමග අංක 4021 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව A 34/138 (වෙනත් විස්තර තීරුව) යටතේ මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

ඉහතින් දැක්වෙන්නේ පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල වැදිරට කෝරළේ, මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ විහාරමුල්ල 126/F ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මුප්පනේ ග්‍රාමයේ පිහිටි "වැවඅරාවහේන *නොහොත්* වැවඅරාව" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන සී. පත්මනාදන් යන අය විසින් සාදන ලද 1980 දෙසැම්බර් 16 දාතම හා අංක $306^{A}$/80 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරටः මොනරාගල - වැදිකුඹුර ප්‍රධාන පාර සහ මෙම ඉඩමේ කොටසක්, නැගෙනහිරට : කම්බි වැට, දකුණට : කම්බි වැට සහ මෙම ඉඩමේ කොටසක් සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකක් (රූඩ්. 1) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග අංක $306^{A}$/80 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව A 38/85 යටතේ මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

02 - 825/1

## සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

අයිකොනික් ලෑන්ඩ්මාර්ක් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංකය : 0046 1000 3333.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2023.12.14 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හතළිස් කෝටි තිස් හය ලක්ෂ දහ හතර දහස් දෙසිය විසි දෙකයි ශත අසූ හතක (රු. 403,614,222.87) මුදල ද, 2023.11.22 දින සිට අංක 1841, 2334 සහ 2496 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් අසූ ලක්ෂ හතළිස් හත් දහස් තුන්සිය හතයි ශත හතළිස් හතක (රු. 8,047,307.47) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate +Four decimal Five per centum (AWPLR + 4.5%) per annum හා තවත් රුපියල් තුන් ලක්ෂ විසි පන් දහස් පන්සිය දහයයි ශත අනූවක (රු. 325,510.90) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate +Four decimal Five per centum (AWPLR + 4.5%) per annum හා තවත් රුපියල් එක්කෝටි තිස් එක් ලක්ෂ හැත්තෑ පන් දහසක (රු. 13,175,000) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate + One per centum (AWPLR + 1%) per annum හා තවත් රුපියල් තිස් එක් කෝටි තිස් හය ලක්ෂ හැට නව දහස් අනූ තුනයි ශත හැත්තෑ අටක (රු. 313,669,093.78) මුදලක් සඳහා වාර්ෂිකව සියයට හයයි දශම නමයයි තුනක් (6.93%) හා තවත් රුපියල් එක්කෝටි දොළොස් ලක්ෂ පනස් හතර දහස් එකසිය හතළිස් එකයි ශත හැට හතරක (රු. 11,254,141.64) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහක් (15.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2024.01.12 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2024.01.12 දින සහ ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි,

**2024.04.08 වැනි දින පෙ.ව. 10.30 ට**

පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන එන්. යූ. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, මහපලාත කෝරළේ, බන්ඩාරවෙල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ මහ නගර සභා සීමාවන් තුළ බන්ඩාරවෙල - නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ බිබිලේ ග්‍රාමයේ පිහිටි "තඹවෙල්වගෙරපතන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ඒ. එම්. කේ. කරුණාරත්න යන අය විසින් සාදන ලද 2012.12.05 දාතම හා අංක 2004/B දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 4 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්ඃ උතුරට : ලොට් 6, නැගෙනහිරට : ලොට් 5, දකුණට : ප්‍රධාන පාර සඳහා වෙන්කිරීම සහ බස්නාහිරට : පාර සඳහා වෙන්කිරීම, රජයේ ඉඩම සහ පිවිසුම් මාර්ගය යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තුනයි දශම හතයි බිංදුවක් (රූ. 1, පර්. 3.70) හෝ හෙක්ටයාර 0.1104ක් විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2004/B දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව V 22/124 යටතේ බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් ඉඩම් කොටස දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය :

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, මහපලාත කෝරළේ, බන්ඩාරවෙල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ මහ නගර සභා සීමාවන් තුළ බන්ඩාරවෙල - නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ බිබිලේ ග්‍රාමයේ පිහිටි "තඹවෙල්වගෙරපතන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ඒ. එම්. කේ. කරුණාරත්න යන අය විසින් සාදන ලද 2012.12.05 දාතම හා අංක 2004/B දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 6 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්ඃ උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස, නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ බස්නාහිරට : පාර සඳහා වෙන්කිරීම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ තුනයි දශම හයක් (පර්. 13.6) හෝ හෙක්ටයාර 0.0343ක් විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2004/B දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව V 22/123 යටතේ බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

ඉහතින් සඳහන් වන්නේ පහත ඉඩම් කොටසේ නැවත මිනුමක් ඒකාබද්ධයක් සහ උපබෙදුම්ය :

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, මහපලාත කෝරළේ, බන්ඩාරවෙල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ මහ නගර සභා සීමාවන් තුළ බන්ඩාරවෙල - නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ බිබිලේ ග්‍රාමයේ පිහිටි "තඹවෙල්වගෙරපතන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. ඩබ්ලිව්. නන්දසේන යන අය විසින් සාදන ලද 1998.09.20 දාතම හා අංක 1459 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 2 සහ 3 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරටඃ බොකලවල සහ වෙනත් අය විසින් හිමිකම් කියන ඉඩම සහ මෙම ඉඩමේ ඉතිරි කොටස, නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස, ඇළපාර සහ බණ්ඩාරවෙල ඉංජිනේරුට අයිති පරිශ්‍රයන් සහ සිමෙන්ති කානුව, දකුණට : අංක 1459 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් නිරූපණය කරන ලද බදුල්ල පාර සඳහා වෙන්කිරීම සහ බස්නාහිරට : සීවලි මාවත සහ රජයේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් තිස් හතරක් (රූ. 2, පර්. 34) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1459 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව J 105/251 යටතේ බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

02 - 825/2

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

ආර්. සේනානායක සහ එන්. පී. පී. මල්කාන්ති
ගිණුම් අංකය : 1010 5778 2694.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2023.04.27 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව 2023 අප්‍රේල් 03 දිනට ලැබිය යුතු සහ අයවිය යුතු රුපියල් හත් කෝටි හැට අට ලක්ෂ අනූ අට දහස් එකසිය අනූවයි ශත අසූ තුනක (රු. 76,898,190.83) මුදල ද, 2023 අප්‍රේල් මස 04 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පන් කෝටි දාහත් ලක්ෂ හතලිස් හය දහස් දෙසිය හැත්තෑ තුනයි ශත පනස් හතක (රු. 51,746,273.57) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහයක් (10%), රුපියල් එක් කෝටි පනස් තුන් ලක්ෂ තිස් පන් දහස් පන්සිය හතලිස් පහක (රු. 15,335,545.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට නවයක් (9%) හා තවත් රුපියල්

හැට එක් ලක්ෂ අසූ හය දහස් අටසිය විසි පහයි ශත දාහතක (රු. 6,186,825.17) මුදලක් සඳහා වාර්ෂිකව සියයට එකොළහක් (11%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා 2023.06.23 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* සහ 2023.06.15 දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි, උපලේඛන අංක 1 හි දේපළ හා පරිශ්‍රයන්,

**2024.03.19 වැනි දින පෙ.ව. 11.00 ට,**

සහ උපලේඛන අංක 2 හි දේපළ හා පරිශ්‍රයන්,

**2024.03.19 වැනි දින ප.ව. 1.30 ට,**

පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

1. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කඳබොඩ පත්තුවේ, හක්මන ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ වැපත ඉර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වැපත ඉර පිහිටි "අවරියා මෙස්ත්‍රිරාලගේ ඉරිකොන්ඩා *නොහොත්* මෙස්ත්‍රීරාලගේ ඉරිකොන්ඩා" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. කේ. ඒ. හේමචන්ද්‍ර යන අය විසින් සාදන ලද 2014.08.05 දාතම හා අංක 14/220 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : මෙම ඉඩමේ ලොට් A නැගෙනහිරට : කුඩාගොඩ සහ හින්කොන්ද *නොහොත්* පරණදිවෙල, දකුණට : මෙම ඉඩමේ ලොට් 2 සහ බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් 2 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ හතරයි දශම හයයි තුනක් (පර්. 14.63) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 14/220 දරන පිඹුරට අනුව ය.

   එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

   දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කඳබොඩ පත්තුවේ, හක්මන ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ වැපත ඉර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වැපත ඉර පිහිටි "අවරියා මෙස්ත්‍රීරාලගේ ඉරිකොන්ඩා *නොහොත්* මෙස්ත්‍රීරාලගේ ඉරිකොන්ඩා" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. රංචාගොඩ යන අය විසින් සාදන ලද 1996.02.20 දාතම හා අංක 962 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : හක්මන සිට බෙලිඅත්ත දක්වා ප්‍රධාන පාර නැගෙනහිරට : කුඩාගොඩ සහ හින්කොන්ද *නොහොත්* පරණදිවෙල දකුණට : මෙම ඉඩමේ ලොට් 2 සහ බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් 2 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි එකයි දශම හතයි හතරයි පහක් (A.0, R.0 P.21.745) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 962 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව R90/56 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර මහ නගර සභා සීමාවන් තුළ සහ මාතර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ නුපේ - 415 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ නුපේ පිහිටි ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් සත්‍යාපනය ලද කැඩස්තර් සිතියම් අංක 820034 (බ්ලොක් අංක 02) හි නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 126 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : මෙම ඉඩමේ ලොට් 75 සහ 74, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 128 සහ 160 දකුණට : මෙම ඉඩමේ ලොට් 127 සහ බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් 77 සහ 125 (මහ නගර සභා පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි හයයි නමයයි තුනක් (0.0693 Hec.) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී කැඩැස්තර් සිතියම් අංක 820034 ට අනුව හිමිකම් සහතික පත්‍ර අංක 00170009830, මාතර යටතේ මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

   ලොට් 126 වශයෙන් ලකුණුකොට ඇති එකී ඉඩම් කොටස බලයලත් මානක තැන පී. ඩබ්ලිව්. අබේගුණවර්ධන යන අය විසින් සාදන ලද 2019.01.24 දාතම හා අංක 1323 දරන පිඹුරේ නිරූපිත ලොට් A වශයෙන් දැන් ලකුණුකොට ඇති නැවත මිනුමකි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

02 - 824

**ඩීඑෆ්සීසී බැංක් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1 වන වෙන්දේසිය

**පොළොන්නරුව සෝමාවතිය චෛත්‍යය පාරේ පිහිටි රූඩ්. 1, පර්චස්. 11 ක් විශාලැති අගනා දේපළ,**

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පොළොන්නරුව මහ නගර සභා සීමාවේ, මැද පත්තුවේ පොළොන්නරුව නගරයේ ග්‍රාම නිලධාරි වසමේ පොළොන්නරුව නගරයේ පිහිටි "කඩවෙල්දමන" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. කොටඹගේ විසින් 2004 අගෝස්තු මස 8 වැනි දින සාදන ලද අංක 1221 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කර සීමා නිර්ණය කොට ඇති ලොට් 1 දරන බිම් කැබැල්ල.

ප්‍රසිද්ධ නොතාරිස් එස්. රණතුංග විසින් 2020 දෙසැම්බර් මස 24 වැනි දින සහතික කරන ලද අංක 5036 දරන DFCC බැංක් පීඑල්සී නමට ලියන ලද්දා වූ බැඳුම්කරයන් මත අයවිය යුතු මුදල ගෙවීමට C L K Holdings International(Private) Limited මල්ලැහේ විදනලාගේ සෝමසිලී සහ විදාන ගමාච්චිඩගේ සුජීව ශ්‍රියා කුමාරි ණයකරුවන්/උකස්කරුවන් වශයෙන් පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත සඳහන් දේපළ,

**2024 ක් වූ මාර්තු මස 13 වැනි දින ප.ව.3.00ට,**

දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට ප්‍රවිශ්ට වන මාර්ගය* .- පොළොන්නරුව ආරෝග්‍යශාලා මංසන්ධියේ සිට සෝමාවතිය චෛත්‍යය දෙසට මීටර් 100ක් පමණ ගමන් කර ආරෝග්‍යශාලා පරිශ්‍රය අවසානයේ පිහිටා ඇති පුද්ගලික පාරේ මීටර් 50ක් පමණ ගමන් කිරීමෙන් පසු පාර අවසානයේ අදාළ දේපළ පිහිටා ඇත.

2 වන වෙන්දේසිය

**පොළොන්නරුව සෝමාවතිය චෛත්‍යය පාරේ පිහිටි රූඩ් 2ක් විශාලැති අගනා දේපළ,**

උතුරු මැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පොළොන්නරුව ප්‍රාදේශීය සභා සීමාවේ මැද පත්තුවේ පොළොන්නරුව නගරයේ ග්‍රාම නිලධාරි වසමේ වෙඩිච්චිලේ ග්‍රාමයේ පලුගස්දමන ග්‍රාමයේ පිහිටි බලයලත් මිනින්දෝරු පී. බී. ඉලංගකෝන් විසින් 2010 ජනවාරි මස 23 වැනි දින මැන සාදන ලද අංක 2010/ Po /23 දරන පිඹුරේ ලොට් 01 දරන බිම් කැබැල්ල.

ප්‍රසිද්ධ නොතාරිස් එස්. රණතුංග විසින් 2020 දෙසැම්බර් මස 24 වැනි දින සහතික කරන ලද අංක 5038 දරන DFCC බැංක් පීඑල්සී නමට ලියන ලද්දා වූ බැඳුම්කරයන් මත අයවිය යුතු මුදල ගෙවීමට C L K Holdings International(Private) Limited මල්ලැහේ විදනලාගේ සෝමසිලී සහ විදාන ගමාච්චිඩගේ සුජීව ශ්‍රියා කුමාරි ණයකරුවන්/උකස්කරුවන් වශයෙන් පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත සඳහන් දේපළ,

**2024ක් වූ මාර්තු මස 13 වැනි දින ප.ව.3.30ට,**

දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩිදුර විස්තර සඳහා* 2023.11.24 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට්* පත්‍රයද, 2023.11.13 වැනි දින "දිවයින" "දි අයිලන්ඩ්" පුවත්පත් සහ 2023.11.14 වැනි දින "තිනක්කුරල්" යන පුවත්පත් බලන්න.

*දේපළට ප්‍රවිශ්ට වන මාර්ගය* .- පොළොන්නරුව ආරෝග්‍යශාලා මංසන්ධියේ සිට සෝමාවතිය චෛත්‍යය දෙසට කි.මී. 3.8ක් පමණ වලේකඩේ මන්සන්දිය දක්වා ගමන් කර වමට හැරී සිංහපුර පාරේ මීටර් 50ක් පමණ ඉදිරියට ගමන් කිරීමෙන් පසු අදාළ දේපළ පාරේ වම් පසින් පාරට මුහුණලා පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුය :-

(01) ගැණුම් මුදලින් (10%) ක් ද,
(02) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක්ද,
(03) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් සහ ඒ මත අයවිය යුතු බදුද,
(04) සියළුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද,
(05) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1500/-ක් ද,
(06) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු ද වේ.

ගැණුම් මිලේ ඉතිරි 90%ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවතේ අංක 73, ඩීඑෆ්සීසී බැංක් හි ණය සම්බන්ධීකරණ කළමනාකාරිණී, ණය පුණරුත්ථාපන සහ අයකිරීම්ගෙන් විමසන්න. දුරකතන අංක : 0112371371.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන : 2873656, 0777 672082,
ෆැක්ස් : 2871184.

02 - 754

**හැටන් නැෂනල් බැංකුව පීඑල්සී - වේයන්ගොඩ ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසිය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිහාරිය අංක 318 දරන ග්‍රාම නිළධාරි වසමේ සියණෑ කෝරලේ උඩුගහ පත්තුවේ අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ නාඹදළුව පිහිටි ''මල්වත්ත නාඹදළුව'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. පී. පී. ජයසුන්දර විසින් 2020 නොවැම්බර් මස 7 වන දින සාදන ලද අංක 3701 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 1 A දරන ඉඩම් කැබැල්ල,

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. පී. කේ. රාජපක්ෂ විසින් 2022 අප්‍රේල් මස 8 වැනි දින සහතික කරන ලද අංක 504 දරන හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ බැඳුම්කරයන් මත අයවිය යුතු මුදල් ගෙවීමට මොහමඩ් උවයිස් මොහමඩ් ෆාරස් ණයකරු වශයෙන් පැහැර හැර ඇති බැවින් ඉහත සඳහන් බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත සඳහන් දේපළ,

**වර්ෂ 2024 ක්වූ මාර්තු මස 20 වන දින පෙරවරු 10.00ට**

අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා කරුණාකර 2023.10.20 වන දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* සහ 2023.11.03 වන දින ''මව්බිම'' ''ඩේලි මිරර්'' සහ ''තිනක්කුරල්'' පුවත්පත් බලන්න.

*දේපළට ප්‍රවිශ්ට වන මාර්ගය.*-නිට්ටඹුවේ සිට කොළඹ දෙසට කි. මී. 2 3/4 පමණ ගම්මොට පාර දක්වා ගමන් කර වමට හැරී කට්ටොට පාරේ මීටර් 800ක් පමණ ඉදිරියට ගමන් කිරීමෙන් කට්ටොට පාර මුහුණ ලා පාරේ වම් පසින් අදාළ දේපළ පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි :

(1) ගැණුම් මුදලින් 10% ක් ද,
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් ද,
(3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් ද,
(4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද,
(5) ලිපිකරු සහ සොෂක ගාස්තු වශයෙන් රු. 2,000 ක් ද,
(6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,500 ක් ද වේ.

ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි. දින 30ක් ඇතුළත ඉතිරි මුදල් ගෙවීමට අපොහොසත්වුවහොත් ගෙවන ලද 10% ක මුදල ආපසු නොගෙවනු ලබන අතර දේපළ නැවත විකිණීමේ අයිතිය බැංකුව සතුය.

*දේපළ පිළිබඳ වැඩි විස්තර දැනගැනීම පිණිස* කොළඹ 10, ටී. බී. ජයා පාරේ, වරිපනම් අංක 479 දරන පරිශ්‍රයේ පිහිටි හැටන් නැෂනල් බැංකු පී. එල්. සී. හි ජ්‍යෙෂ්ඨ කළමණාකරු - අයකිරීම් ගෙන් විමසන්න.

දුරකථන අංක : 011 2661828 හෝ 0112 661866 අමතන්න.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන : 2873656, 0112871184, 0777 672082, 0777449452

02 - 753

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී - කඳාන ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ හෙට්ටිගේ දොන් සුවිනි ලසන්තා සහ රන්දෙණි ආරච්චිගේ දොන් චමිල් තාරක බන්ධනදායී ලෙස මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් පී. ඒ. එම්. ටී. පෙරේරා විසින් සහතික කරන ලද 2019 අප්‍රේල් මස 26 දිනැති අංක 1010 දරන උකස් බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත උකස් කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලේ, රාගම් පත්තුවේ ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජා-ඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 186 රිලවුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කඳාන පිහිටි ''කෝන්ගහවත්ත, සියඹලා ගහවත්ත සහ කැටකැල්ලගහවත්ත'' ලෙස හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් සාදන ලද 1984.12.22 දිනැති අංක 126 දරන පිඹුරේ ලොට් 04 ලෙස දක්වා බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි ඇතුළුව අනෙකුත් සියළුම දේ සමග පර්චස් තිස්පහයි දශම නමයයි අටක් (අ. 0, රූ. 0, පර්. 35.98) විශාල ඉඩම් කොටස. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව J471/102හි ලියාපදිංචි කර ඇත.

නමුත් ඉහත සඳහන් ඉඩම නැවත මැන පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ජා-ඇල ප්‍රාදේශීය සභා සීමාවේ අංක 186 රිලවුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කඳාන පිහිටි ''කෝන්ගහවත්ත, සියඹලාගහවත්ත සහ කැටකැල්ල ගහවත්ත'' ලෙස හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු එම්. ඩී. එන්. ටී. පෙරේරා විසින් සාදන ලද 2004.11.05 දිනැති අංක 3416 දරන පිඹුරේ ලොට් 04 ලෙස දක්වා බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැව්ලි ඇතුළුව අනෙකුත් සියළුම දේ සමග පර්චස් තිස්පහක් (පර්. 35) විශාල ඉඩම.

ලංකා බැංකුව,
හිඟුරක්ගොඩ ශාඛාව.
2024 පෙබරවාරි 05 වැනි දින.

02 - 834

---

### ඩී එෆ් සී සී බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

(ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී හි අනුප්‍රාප්තික) ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ලසිතා සෙහානි ජයසිංහ විසින් ලියා සහතික කරන ලද 2004.10.28 දිනැති අංක 353 දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් වනසිංහ ආරච්චිගේ ධීමන්ත

විරාජ් වනසිංහ විසින් ලියා සහතික කරන ලද 2007.02.09 දිනැති අංක 537 දරන උකස් බැඳුම්කරය යන උකස් බැඳුම්කරයන් මත අයවිය යුතු ගෙවීම කිරීම, සිය ලියාපදිංචි කාර්යාලයේ පිටකෝට්ටේ පවත්වාගෙන යන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද අංක එන්(පීවීඑස්) 6444 දරන කේන් ඇපරල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පැහැර හැර ඇති හෙයින් ද,

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම් පත්තුවේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මිරිජ්ජවෙල ගමේ පිහිටි මිරිජ්ජවෙලකැලේ කපුවත්ත සහ කරගන්ලේවාගොඩැල්ල (කරගන්ලේවාගොඩැල්ල වත්ත යනුවෙන් ද හඳුන්වනු ලබන) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අජිත් රන්ජන් වීරසූරිය විසින් සාදන ලද 2000 ඔක්තෝබර් මස 21 දිනැති අංක 1337B දරන පිඹුරේ ලොට් 411GB වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කොටසට (සර්වේයර් ජනරාල්වරයා විසින් සහතික කරන ලද අවසන් ගම් සිතියම් 54හි ලොට් 411 වශයෙන් පෙන්වන සර්වේයර් ජනරාල්වරයා විසින් සාදා ඔහුගේ භාරගේ තබා ඇති (අංක 0/51 පිඹුර) ක්ෂේත්‍ර සටහන් අංක 38/ක්‍ෂෙත්‍ර පොත් අංක ඊඩීඑම් 450 වශයෙන් දක්වෙන ඉඩමේ කොටසක් වන) එකී අංක 1337B දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් අක්කර තුනයි පර්චස් බිංදුවයි දශම දෙකයි බිංදුවක් (අ.3, පර්. 0.20) *හෙවත්* හෙක්. 1.21456ක් විශාල ඉඩම වේ. මෙය හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචිකර ඇත.

**දෙවන උපලේඛනය**

| *අංකය* **No.** | *වර්ගය* ***Type*** | *නිෂ්පාදනය* ***Make*** | *මාදිලි අංකය* ***Model No.*** |
|---|---|---|---|
| 1 | සිංගල් නීඩ්ල් ෆීඩ් මැෂින් [Single Needle Feed Machine] | ජුකී [Juki] | DDL 8500-7 |
| 2 | සිංගල් නීඩ්ල් ෆීඩ් මැෂින් [Single Needle Feed Machine] | යොකො [Yoko] | DCI 8500 N |
| 3 | සිංගල් නීඩ්ල් ෆීඩ් මැෂින් [Single Needle Feed Machine] | ජුකී [Juki] | DLN-5410 N |
| 4 | සිංගල් නිඩ්ල් සයිඩ් කටර් මැෂින් [Single Needle Side Cutter Machine] | ජුකී [Juki] | DLN-5200 N |
| 5 | සිංගල් නිඩ්ල් සයිඩ් කටර් මැෂින් [Single Needle Side Cutter Machine] | යොකො [Yoko] | DCL 8520 N |
| 6 | ඩබල් නීඩ්ල් මැෂින් [Double Needle Machine] | ජුකී [Juki] | LH 3128 F |
| 7 | ඩබල් නිඩ්ල් මැෂින් [Double Needle Machine] | ජුකී [Juki] | BL-B 842-5 |
| 8 | ඩබල් නිඩ්ල් ස්ටොක් මැෂින් [Double Needle Stock Machine] | ජුකී [Juki] | LK 1900 |
| 9 | ඕවර්ලොක් 5 ත්‍රෙඩ් මැෂින් [Overlock 5 Thread Machine] | ජුකී [Juki] | MO 3616 |
| 10 | ඕවර්ලොක් 5 ත්‍රෙඩ් මැෂින් [Overlock 5 Thread Machine] | ජෙම්සි [Gemsy] | Gem 757 R |
| 11 | ඕවර්ලොක් 6 ත්‍රෙඩ් මැෂින් [Overlock 6 Thread Machine] | ජුකී [Juki] | MO 3643 |
| 12 | බා ටැක් මැෂින් [Bar Tack Machine] | ජුකී [Juki] | LK 1900 |
| 13 | බා ටැක් මැෂින් [Bar Tack Machine] | ජුකී [Juki] | LK1900HS-A |

| *අංකය* **No.** | *වර්ගය* **Type** | *නිෂ්පාදනය* **Make** | *මාදිලි අංකය* **Model No.** |
|---|---|---|---|
| 14 | බටන් ඇටෑච් මැෂින් [Button Attach Machine] | ජුකී [Juki] | LK 1903 |
| 15 | ෆීඩ් ඔෆ් ද ආම් මැෂින් [Feed of the Arm Machine] | | MS 12610 V045 |
| 16 | බටන් හෝල් මැෂින් [Button Hole Machine] | ජුකී [Juki] | LBH 781 |
| 17 | ෆ්ලැට් ලොක් ලූප් මැෂින් [Flat Lock Loop Machine] | කන්සාල් [Kansal] | B 2000C |
| 18 | කන්සාල් ස්පෙෂල් මැෂින් [Kansal Special Machine] | කන්සාල් [Kansal] | BFB1404PSF |
| 19 | කන්සාල් ස්පෙෂල් මැෂින් [Kansal Special Machine] | කන්සාල් [Kansal] | DFB-1404PMD |
| 20 | අයි බටන් හෝල් මැෂින් [Eye Button Hole Machine] | ජුකී [Juki] | 5100-030 |
| 21 | ෆ්ලැට් ලොක් මැෂින් [Flat Lock Machine] | ජුකී [Juki] | W 600 |
| 22 | ෆ්ලැට් ලොක් මැෂින් [Flat Lock Machine] | ජුකී [Juki] | W 500 |
| 23 | ෆ්ලැට් ලොක් මැෂින් [Flat Lock Machine] | ජුකී [Juki] | WT 200 |
| 24 | ෆියුසිං මැෂින් [Fusing Machine] | හෂිමා [Hashima] | 55 |
| 25 | ත්‍රෙඩ් සකර් [Thread Sucker] | න්ගයිෂින් [Ngaishine] | NS 55 |
| 26 | ස්පොට් රිමූවර් [Spot Remover] | පෝනි [Pony] | |
| 27 | ස්ට්‍රැපිං මැෂින් [Strapping Machine] | න්ගයිෂින් Ngaishine | 1202 |
| 28 | බෑන්ඩ් නයිෆ් මැෂින් [Band Knife Machine] | න්ගයිෂින් Ngaishine | NS 810 |
| 29 | වැකුම් අයන් ටේබල් [Vaccum Iron Table] | න්ගයිෂින් Ngaishine | NS 327 UF |
| 30 | ෆුල් ස්ටීම් අයන් [Full Steam Iron] | නමාටෝ [Namato] | |
| 31 | බොටල් අයන් Bottle Iron | | |
| 32 | ත්‍රෙඩ් රිවයින්ඩර් [Thread Rewinder] | හෂිමා [Hashima] | |
| 33 | ක්ලෝත් ඩ්‍රිල් මැෂින් [Cloth Drill Machine] | ඊස්ට්මන් [Eastman] | |

| අංකය<br>**No.** | වර්ගය<br>**Type** | නිෂ්පාදනය<br>**Make** | මාදිලි අංකය<br>**Model No.** |
|---|---|---|---|
| 34 | බොයිලර්<br>[Boiler] | මියුරා<br>[Miura] | SZ 160 L |
| 35 | කටිං මැෂින්<br>[Cutting Machine] | ඊස්ට්මන්<br>[Eastman] | 629 |
| 36 | කොම්ප්‍රෙෂර්<br>[Compressor] | 2800065 | |
| 37 | ජෙනරේටර් 160 කේවීඒ<br>[Generator 160 KVA] | විල්සන්<br>[Wilson] | P 200 H |
| 38 | නීඩ්ල් ඩිටෙක්ටර්<br>[Needle Detector] | නෙට් - 30<br>[Net – 30] | |

ඉහත සඳහන් දේපළ සහ යන්ත්‍ර සූත්‍ර **2024 මාර්තු මස 25 වැනි දින පෙරවරු 10.30**ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.*- කොළඹ සිට A2 ප්‍රධාන මාර්ගය ඔස්සේ කි.මී. 233 ක පමණ දුරක් ගොස් මිරිජ්ජවිල දක්වා පැමිණ 233 වන කි.මී. කණුව අසලින් වම් පසට ඇති සූරියවැව මාර්ගයට හැරී තවත් කි.මී. 3/4 ක පමණ දුරක් ගොස් වම් පසට ඇති කර්මාන්තපුරය දෙසට දිවෙන මාර්ගයට හැරී එම මාර්ගය ඔස්සේ මීටර් 250 ක් පමණ දුරක් ගොස් කර්මාන්තපුරය දෙසට දිවෙන මාර්ගයේ තවත් මීටර් 200 ක පමණ දුරක් ගිය විට අදාළ දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.- රජයේ ගැසට් පත්‍රයේ* 2024.01.12 වන දින පළවී ඇති අතර, දිවයින, ද අයිලන්ඩ් පුවත්පත්වල 2023.12.29 වන දින ද තිනකුරල් පුවත්පතේ 2023.12.31 වන දින පළවී ඇත.

*ගෙවීම් ක්‍රමය.*- සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලා වෙන්දේසිය අවසන් වූ වහාම වෙන්දේසිකරු වෙත පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1%ක් (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්),
4. නොතාරිස් ගාස්තු හා විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000/-
5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 2,000/-,
6. සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

*වැඩි විස්තර සඳහා විමසන්න.*- අයකර ගැනීම් සහ පුනරුත්ථාපන අංශය, ඩී. එෆ්. සී. සී. බැන්ක් පීඑල්සී, අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02, දුරකථනය : 011-2371371

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු සහ උසාවි කොමසාරිස්,

ටී ඇන්ඩ් එච් ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොලොන්නාව.
දුරකථන අංක : 011 3068185, 011 2572940.

02 - 785

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

### කැරගල දෙමළගම දනව්කන්ද එස්ටේට් හි පිහිටි අක්කර 10 ක අගනා ඉඩමක්

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කේරළයේ ගඟබොඩ පත්තුවේ, දොම්පේ කැරගල ප්‍රාදේශීය සභාව උප කාර්යාලය සීමාව ඇතුළත, දෙමළගම ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, උතුරින් : ඩී. සී. පාරේ හා පාරෙන්, නැගෙනහිරින් : පාරෙන්, දකුණින් : අංක 3 බිම් කැබැල්ලෙන් සහ බස්නාහිරින් : ජේ. කේ. අලගියවන්න හා කේ. ඩී. එල්. ප්‍රියන්ති විසින් හිමිකම් දක්වා සිටින එම ඉඩමේම කොටසින් මායිම් වූ ද බලයලත් මිනින්දෝරු ටී. ඒ. ඩී. ඒ. සේනානායක විසින් සාදන ලද අංක 534 ඒ හා 1991 පෙබරවාරි මස 17 වැනි දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් අක්කර හයකින් (අ.6,) යුක්ත වූ ද, ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 369/220 වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, "දනව්කන්ද එස්ටේට්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් එකී අංක 534 ඒ දරන පිඹුරේ නිරූපිත අංක 2 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේ ද සමග වේ.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියණෑ කේරළයේ ගඟබොඩමැද සහ අධිකාරි පත්තුවේ, කිරිකිත්ත පරකඩුමුල්ල වලරම්බා අහුගම්මන සහ දෙමළගම ග්‍රාමයේ පිහිටා ඇත්තා වූද, උතුරින් : අංක 2 බිම් කැබැල්ලෙන් හා පාරෙන්, නැගෙනහිරින් : පාරෙන්, දකුණින් : ජේ. කේ. අලගියවන්න හා කේ. ඩී. එල්. ප්‍රියන්ති විසින් හිමිකම් දක්වා සිටින එම ඉඩමේම කොටසින් සහ බස්නාහිරින් : ජේ. කේ. අලගියවන්න හා කේ. ඩී. එල්. ප්‍රියන්ති විසින් හිමිකම් දක්වා සිටින එම ඉඩමේම කොටසින් මායිම් වූ ද බලයලත් මිනින්දෝරු එම්. ජී. නසූර් විසින් සාදන ලද අංක 89035 හා 1989 දෙසැම්බර් මස 15 වන දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් අක්කර හතරයි පර්චස් දශම තුනකින් (අ.4, පර්. 0.3) යුක්ත වූ ද, ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 367/212 වෙළුමේ/පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, "දනව්කන්ද එස්ටේට්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් ඉහත කී අංක 89035 දරන පිඹුරේ නිරූපිත අංක 3 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේ ද සමග වේ.

2 හා 3 වශයෙන් සලකුණු කරන ලද එකී ඉඩම්, අංක 286 ඒ/2002 දරන මෑතක දී කරන ලද මැනුම් පිඹුරක, පහත සඳහන් පරිදි විස්තර කර තිබේ.

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළයේ ගඟබොඩ පත්තුවේ, දෙමළගම ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද උතුරින් : ජේ. කේ. අලගියවන්න හා කේ. ඩී. එල්. ප්‍රියන්ති විසින් හිමිකම් දක්වා සිටින එම ඉඩමේම කොටසින් හා මූකලාන සිට කැරගල දක්වා වූ ඩී. සී. පාරෙන් සහ වැලි පාරෙන්, නැගෙනහිරින් : වැලි පාරෙන්, දකුණින් අංක 2 බිම් කැබැල්ලෙන් සහ බස්නාහිරින් : ජේ. කේ. අලගියවන්න හා කේ. ඩී. එල්. ප්‍රියන්ති විසින් හිමිකම් දක්වා සිටින එම ඉඩමේම කොටසින් මායිම් වූ ද, බලයලත් මිනින්දෝරු ඒ. පී. ඉන්ද්‍රලාල් සොයිසා විසින් සාදන ලද අංක 286 ඒ/2002 සහ 2002 නොවැම්බර් මස 30 වන දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් අක්කර හයයි පර්චස් දාහතකින් (අ. 6, පර්. 17) යුක්ත වූ ද, "දනව්කන්ද" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් ඉහත කී අංක 286ඒ/2002 දරන පිඹුරේ නිරූපිත අංක 1 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේ ද සමග වේ.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළයේ ගඟබොඩ පත්තුවේ, දෙමළගම ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද උතුරින් : අංක 1 බිම් කැබැල්ලෙන්, නැගෙනහිරින් : වැලි පාරෙන්, දකුණින් : ජේ. කේ. අලගියවන්න හා කේ. ඩී. එල්. ප්‍රියන්ති විසින් හිමිකම් දක්වා සිටින එම ඉඩමේම කොටසින් සහ බස්නාහිරින් : ජේ. කේ. අලගියවන්න හා කේ. ඩී. එල්. ප්‍රියන්ති විසින් හිමිකම් දක්වා සිටින එම ඉඩමේම කොටසින් මායිම් වූ ද, අංක 286 ඒ/2002 දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් අක්කර හතරකින් (අ. 4) යුක්ත වූ ද, "දනව්කන්ද" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් ඉහත කී අංක 286ඒ/2002 දරන පිඹුරේ නිරූපිත අංක 2 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේ ද සමග වේ.

අ) රුපියල් 5,245,866.79 ක මුදලක්, රුපියල් 4,146,000/- ක් වූ ඉතිරි ප්‍රාග්ධන මුදල් මත 2015 මාර්තු මස 01 දින සිට 2022 අගෝස්තු මස 09 වැනි දින දක්වා වර්ෂයකට 8.97% ක පොළියක් ද ඉන් පසුව මුළු මුදල සම්පූර්ණයෙන් ගෙවා හා අවසාන වශයෙන් බේරුම් කරනු ලබන තෙක් මෙම තීන්දු ප්‍රකාශය ඇතුළත් කරනු ලබන දිනය වන 2022 අගෝස්තු මස 10 වැනි දින සිට නෛතික පොළිය ද, විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට අණකොට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින් ද,

ආ) රුපියල් 4,269,254/72 ක මුදලක් රු. 3,380,000/- ක් වූ ඉතිරි ප්‍රාග්ධන මුදලක් මත 2015 මාර්තු 01 වැනි දින සිට මෙම තීන්දු ප්‍රකාශය ඇතුළත් කරනු ලබන දිනය වන 2022 අගෝස්තු මස 09 වැනි දින දක්වා වර්ෂයකට 12.5% ක පොළියක් ද, ඉන් පසුව මුළු මුදල සම්පූර්ණයෙන් හා අවසාන වශයෙන් බේරුම් කරනු ලබන තෙක් මෙම තීන්දු ප්‍රකාශය ඇතුළත් කරනු ලබන දිනය වන 2022 අගෝස්තු මස 10 වැනි දින සිට නෛතික පොළිය ද, විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට අණකොට තීන්දු කොට ඇති බැවින් ද,

ඇ) රුපියල් 3,539,373.57 ක මුදලක්, ඒ මුදල මත 201 මාර්තු මස 01 වැනි දින සිට 2022 අගෝස්තු මස 09 වැනි දින දක්වා වර්ෂයකට 24% ක පොළියක් ද, ඉන් පසුව මුළු මුදල සම්පූර්ණයෙන් හා අවසාන වශයෙන් බේරුම් කරනු ලබන තෙක් මෙම තීන්දු ප්‍රකාශය ඇතුළත් කරනු ලබන දිනය වන 2022 අගෝස්තු මස 10 වැනි දින සිට නෛතික පොළිය ද, විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට අණකොට තීන්දු කොට ඇති බැවින් ද, එකී මුදල් අයකර ගැනීම පිණිස කොළඹ 01 ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත අංක 21 දරන ස්ථානයේ සහ කොළඹ 07 ධර්මපාල මාවතේ අංක 209 දරන ස්ථානයේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී පැමිණිලිකරු ලෙසට කොළඹ 02 යූනියන් පෙදෙසේ අංක 299 සහ කොළඹ 07 වෝඩ් පෙදෙසේ අංක 28 දරන ස්ථානයේ පිහිටි මැකලම් නර්සරීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයට විරුද්ධව කොළඹ දී පවත්වනු ලබන සිවිල් (වාණිජ) අධිකරණය බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාත් බද වාණිජ මහාධිකරණයේ පවරන ලද අංක එච් සී (සිවිල්) නඩු අංක 590/2015/MR දරන නඩුවෙන් මා වෙත පවරන ලද බලය මත අදාළ දේපළ මා විසින්

**2024 මාර්තු මස 22 වැනි දින පෙරවරු 10.30 ට**

මා විසින් අදාළ දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

*දේපළට ප්‍රවිශ්ඨ වන මාර්ගය* : වැලිවේරිය මංසන්ධියේ පල්ලිය අසල සිට කිරිඳිවැල මාර්ගයේ කි.මී. 7.8 ක් පමණ හේනමුල්ල මංසන්ධිය දක්වා ගමන් කර දකුණට හැරී කැරගල පාරේ ඉදිරියට කි.මී. 3 ක් පමණ ගමන් කර වමට හැරී දෙමළගම පාරේ කි.මී. 2 ක් පමණ සූරියගම විහාර මාවතේ උදාකළ ගම්මානය මංසන්දිය දක්වා ගමන් කර එකී උදාකල ගම්මාන පාරේ (වමට) හැරී මීටර් කිහිපයක් ගමන් කිරීමෙන් පාරේ දකුණු පසින් අදාළ දේපළට ප්‍රවිශ්ඨ වීම පිණිස වානේ යොදා සකස් කරන ලද ගේට්ටුවකින් ඇතුළුවිය හැකිය. ඉහත කී පාරට අඩි 110 ක් පමණ මුහුණලා මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* : වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් ඒ අවස්ථාවේ දී ම වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

(01) ගැණුම් මිලෙන් සියයට විසි පහක් (25%),
(02) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් සියයට එකක් (1%),
(03) වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු වශයෙන් (2.5%) ක් ද,
(04) වෙන්දේසිය සඳහා දරන්නට වූ සියලුම වියදම් ද,
(05) සෝෂක හා ලිපිකරු ගාස්තු වශයෙන් රු. 2,500/= ක මුදලක් ද,
(06) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 7,500/- ක මුදලක්ද වන අතර ගැණුම් මිලේ පරිශේෂය වන 75% ක මුදල වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගරු අධිකරණයේ මෙම නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

වැඩිදුර විස්තර සඳහා කොළඹ 03 ආර්. ඒ. ද මැල් මාවතේ අංක 371 දරන ස්ථානයේ පිහිටි ජුලියස් ඇන්ඩ් ක්‍රීසි නීතිඥ සහ නොතාරිස් සමාගමෙන් විමසන්න. දුරකථන අංක - 0114708300 දිගුව - 408/393.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංකය : 011-2873656, 0777-672082
ෆැක්ස් : 011-2871184.

02 - 752/1

---

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

### පිළියන්දල මඩපාත ෆිනෑන්ස් වත්තේ කැබලි අංක 80 දරන පර්චස් 10.36 ක් විශාලැති අගනා ඉඩම් කැබැල්ලක්

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත දම්පේ පිහිටා ඇත්තා වූ ද දම්පේ දූල්තර පාර වරිපනම් අංක 344/09 දරන්නා වූ ද, උතුරින් : අංක 104 බිම් කැබැල්ල, නැගෙනහිරින් : අංක 81 බිම් කැබැල්ල, දකුණින් : අංක 1645 දරන පිඹුරේ ඒ බිම් කැබැල්ල හා බස්නාහිරින් : අංක 79 අයි දරන බිම් කැබැල්ලෙන් මායිම් වූ ද බලයලත් මිනින්දෝරු කේ. ඩී. පී. වීරසිංහ විසින් සාදන ලද අංක 1661 හා 1999 අගෝස්තු මස 31 වැනි දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම තුනයි හයකින් (පර්. 10.36) යුක්ත වූ ද දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2655/8 වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද "හෙප් පෝරවත්ත" සහ "හේප්කෙර්වත්ත" යනුවෙන් ද හඳුන්වනු ලබන ඉඩමෙන් ඉහත කී අංක 1661 දරන පිඹුරේ නිරූපිත අංක 82 බිම් කැබැල්ල වශයෙන් සළකුණු කරන ලද බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේ ද සමග වේ.

ඒ ඉඩම් කැබැල්ලට මෙහි පහත විස්තර කර ඇති පාරක් සඳහා වෙන් කර ඇති ඉඩම මතුපිටින් හා ඒ ඔස්සේ මාර්ග අයිතිය ද සමග වේ.

01. ඉහත කී දම්පේ පිහිටා ඇත්තා වූ ද, උතුරින් : අංක 103, 72, 60, 63 හා 109 දරන බිම් කැබලිවලින්, නැගෙනහිරින් : අංක 105 දරන බිම් කැබැල්ලෙන්, දකුණින් : 86-73 දරන බිම් කැබැලිවලින්

හා බස්නාහිරින් : අංක 99 දරන බිම් කැබැල්ලෙන් මායිම් වූ ද බලයලත් මිනින්දෝරු කේ. ඩී. පී. වීරසිංහ විසින් සාදන ලද අංක 1661 හා 1999 අගෝස්තු මස 31 වන දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දාහතරයි දශම නවයයි හයකින් (රූ. 01, පර්. 14.96) කින් යුක්ත වූ ද, දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2655/266 වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, "හෙජ් පෝරවත්ත" සහ "හේප්කෙර්වත්ත" යනුවෙන් ද හඳුන්වනු ලබන ඉඩමෙන් ඉහත කී අංක 1661 දරන පිඹුරේ නිරූපිත අංක 104 බිම් කැබැල්ල (මීටර් අඩි 9 ක් පළල ඇති පාරක් සඳහා වෙන්කර ඇති බිම් කැබැල්ල) වශයෙන් සලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල වේ.

02. ඉහත කී දම්පේ පිහිටා ඇත්තා වූ ද උතුරින් : අංක 62 හා 52 හා 107 බිම් කැබලිවලින්, නැගෙනහිරින් : (ප්‍රාදේශීය සභා) පාරෙන් ද, දකුණින් : 106 හා 97 සහ 86 දරන බිම් කැබලි වලින්, බස්නාහිරින් : අංක 104 දරන බිම් කැබැල්ලෙන් මායිම් වූ ද බලයලත් මිනින්දෝරු කේ. ඩී. පී. වීරසිංහ විසින් සාදන ලද අංක 1661 හා 1999 අගෝස්තු මස 31 වන දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් අටයි දශම හයයි තුනකින් (රූ. 01, පර්. 8.63) කින් යුක්ත වූ ද, දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2655/267 වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, "හෙජ් පෝරවත්ත" සහ "හේප්කෙර්වත්ත" යනුවෙන් ද හඳුන්වනු ලබන ඉඩමෙන් ඉහත කී අංක 1661 දරන පිඹුරේ නිරූපිත අංක 105 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කරන ලද වශයෙන් සලකුණු කරන ලද (මීටර් අඩි 9 ක් පළල ඇති පාරක් සඳහා වෙන්කරන ලද බිම් කැබැල්ල) බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල වේ.

3. පාරක් සඳහා වෙන් කරන ලද ඉඩම් කැබලි දක්වා වූ බලයලත් මිනින්දෝරු කේ. ඩී. පී. වීරසිංහ විසින් සාදන ලද අංක 1661 හා 1999 අගෝස්තු මස 31 වැනි දින දරන පිඹුරේ අංක 103 හා 102 බිම් කැබලි මතුපිටින්

අ) රුපියල් 5,245,866/79 ක මුදලක්, රුපියල් 4,146,000/- ක් වූ ඉතිරි ප්‍රාග්ධන මුදල මත 2015 මාර්තු මස 01 වැනි දින සිට 2022 අගෝස්තු මස 09 වැනි දින දක්වා වර්ෂයකට 8.97% ක පොළියක් ද ඉන් පසුව මුළු මුදල සම්පූර්ණයෙන් ගෙවා හා අවසාන වශයෙන් බේරුම් කරනු ලබන තෙක් මෙම තීන්දු ප්‍රකාශය ඇතුළත් කරනු ලබන දිනය වන 2022 අගෝස්තු මස 10 වැනි දින සිට නෛතික පොළිය ද, විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට අණකොට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින් ද,

ආ) රුපියල් 4,269,254/72 ක මුදලක් රු. 3,380,000/- ක් වූ ඉතිරි ප්‍රාග්ධන මුදලක් මත 2015 මාර්තු 01 වැනි දින සිට මෙම තීන්දු ප්‍රකාශය ඇතුළත් කරනු ලබන දිනය වන 2022 අගෝස්තු මස 09 වැනි දින දක්වා වර්ෂයකට 12.5% ක පොළියක්ද, ඉන් පසුව මුළු මුදල සම්පූර්ණයෙන් හා අවසාන වශයෙන් බේරුම් කරනු ලබන තෙක් මෙම තීන්දු ප්‍රකාශය ඇතුළත් කරනු ලබන දිනය වන 2022 අගෝස්තු මස 10 වැනි දින සිට නෛතික පොළිය ද විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට අණකොට තීන්දු කොට ඇති බැවින් ද,

ඇ) රුපියල් 3,539,373/57 ක මුදලක්, ඒ මුදල මත 2014 මාර්තු මස 01 වැනි දින සිට 2022 අගෝස්තු මස 09 වැනි දින දක්වා වර්ෂයකට 24% ක පොළියක් ද, ඉන් පසුව මුළු මුදල සම්පූර්ණයෙන් හා අවසාන වශයෙන් බේරුම් කරනු ලබන තෙක් මෙම තීන්දු ප්‍රකාශය ඇතුළත් කරනු ලබන දිනය වන 2022 අගෝස්තු මස 10 වැනි දින සිට නෛතික පොළිය ද, විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට අණකොට තීන්දු කොට ඇති බැවින් ද, එකී මුදල් අයකර ගැනීම පිණිස කොළඹ 01 ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත අංක 21 දරන ස්ථානයේ සහ කොළඹ 07 ධර්මපාල මාවතේ අංක 209 දරන ස්ථානයේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී පැමිණිලිකරු ලෙසට කොළඹ 02 යූනියන් පෙදෙස අංක 299 සහ කොළඹ 07 වෝඩ් පෙදෙසේ අංක 28 දරන ස්ථානයේ පිහිටි මැකලම් නර්සරීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයට විරුද්ධව කොළඹ දී පවත්වනු ලබන සිවිල් (වාණිජ) අධිකරණය බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාත් බඳ වාණිජ මහාධිකරණයේ පවරන ලද අංක එච් සී (සිවිල්) නඩු අංක 590/2015/MR දරන නඩුවෙන් මා වෙත පවරන ලද බලය මත අදාළ දේපළ මා විසින්

**2024 මාර්තු මස 22 වැනි දින පස්වරු 2.30 ට**

මා විසින් අදාළ දේපළ පිහිටි ස්ථානයේ ද ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසිය හැකි මාර්ගය* : පිළියන්දල හරහා දිවෙන කොළඹ හොරණ මහා මාර්ගයේ පිළියන්දල වට රවුමෙන් දකුණට හැරී මොරටුව දෙසට සුවාරපොළ මංසන්දිය දක්වා ගමන් කර වමට හැරී ශාන්ත මිචෙල් පාරේ මීටර් 200 ක් පමණ ගමන් කර දකුණට හැරී දාම්පේ පාරේ (කරදියාන පාර) දූල්තර පසුකර කි.මී. 2 ක් පමණ ගමන්කර දකුණට හැරී කි.මී. 3 ක් පමණ "ඒෂියන් ෆිනෑන්ස් දේපළ ව්‍යාපෘති සංකීර්ණ පිවිසුම දක්වා ගමන් කර දකුණට හැරී අඩි 30 ක් පමණ පළලැති තාර දමා නිම කර ඇති පාරේ මීටර් 150 ක් පමණ බොල්ගොඩ ඔය දෙසට ගමන් කිරීමෙන් පසු අදාළ දේපළ පාරේ වම් පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* : වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් ඒ අවස්ථාවේම වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

(01) ගැණුම් මිලෙන් සියයට විසි පහක් (25%),
(02) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් සියයට එකක් (1%) ක් ද,
(03) වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු වශයෙන් (2.5%) ක් ද,
(04) වෙන්දේසිය සඳහා දරන්නට වූ සියලුම වියදම් ද,
(05) සෝෂක හා ලිපිකරු ගාස්තු වශයෙන් රු. 2,500/= ක මුදලක් ද,

(06) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 7,500/- ක මුදලක්ද වන අතර ගැණුම් මිලේ පරිශේෂය වන 75% ක මුදල වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගරු අධිකරණයේ මෙම නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

වැඩිදුර විස්තර සඳහා කොළඹ 03 ආර්. ඒ. ද මැල් මාවතේ අංක 371 දරන ස්ථානයේ පිහිටි ජුලියස් ඇන්ඩ් ක්‍රීසි නීතිඥ සහ නොතාරිස් සමාගමෙන් විමසන්න. දුරකතන අංක - 0114708300 දිගුව - 408/393.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 011-2873656, 0777-672082
ෆැක්ස් : 011-2871184

02 - 752/2

---

**හම්බන්තොට දිසා අධිකරණයේ දී ය**

ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

අම්බලන්තොට, තිස්ස පාරේ, අංක 157 දරන ස්ථානයේ "අම්බලන්තොට ශාඛාව" යනුවෙන් හැඳින්වෙන ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇත්තා වූ කොළඹ 01, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවතේ, අංක 21 දරන ස්ථානයේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී

........................ පැමිණිලිකරු.

නඩු අංකය : 7671/MB
ස්වභාවය : උකස්
වටිනාකම : රු.1,995,605/93
කාර්ය පටිපාටිය : සාමාන්‍ය

*එදිරිව*

බිමල් විජේරත්න,
"විජය නිවස"
අද්දරගොඩ පාර, වලව,
අම්බලන්තොට.

........................විත්තිකරුවන්.

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරී පත්‍රය අනුව වර්ෂ 2016 ක් වූ මැයි මස 03 වන දින ලබා දෙන ලද තීන්දුවට අනුව 2023 මැයි මස 24 වන දින තීන්දු ප්‍රකාශය ඇතුලත් කර ඇත.

පැමිණිල්ලේ ආයාචනයේ (අ) ඡෙදයේ අයැද ඇති රු. 1,256,732/8 ක මුදලක් සහ ඒ මත 2014 නොවැම්බර් මස 26 වන දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට 24% බැගින් පොළියද, රු. 353,000/- ක මුදලක් සහ රු. 71,832/26 ක මුදලක් යනුවෙන් එකතුව රු. 424,832/26 ක් වන්නා වූ මුදලක් සහ එකී රු. 353,000/- ක මුදල මත 2014 දෙසැම්බර් මස 17 වන දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට 24% බැගින් වැඩිදුරටත් පොළිය ද රු. 833,000/- ක මුදලක් සහ

රු. 161,116/88 ක මුදලක් යනුවෙන් එකතුව රු. 994,116/88 ක් වන්නා වූ මුදලක් සහ එකී රු. 833,000/- ක මුදල මත 2014 දෙසැම්බර් මස 17 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට 24% බැගින් වැඩිදුරටත් පොළියද සමග විත්තිකරු විසින් පැමිණිලිකාර බැංකුව වෙත ගෙවිය යුතු බවට නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

පැමිණිල්ලේ ආයාචනයේ (ආ) ඡේදයේ අයැද ඇති පරිදි විත්තිකරු විසින් පැමිණිලිකාර බැංකුවට මෙම නඩුවේ තක්සේරු කරන ලද නඩු ගාස්තු ද ගෙවිය යුතු බවට නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින්ද,

තීන්දු ප්‍රකාශයේ සහ මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම සහ ස්ථානය එකී මුදල් ප්‍රමාණයෙන් ගෙවීම සඳහා බන්ධනය වී ඇති බවට සහ ඇස්කීසි කළහැකි බවට නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

වර්ෂ 2016 ක් වූ මැයි මස 03 වන දින හම්බන්තොට දිසා අධිකරණයේ නඩු තීන්දුව ඉටුකිරීමට විත්තිකරු අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී,

වර්ෂ **2024 ක් වූ මාර්තු මස 18 වැනි දින පෙ.ව. 11.30 ට**

මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, නැගෙනහිර ගිරුවා පත්තුවේ මැදගම පිහිටි, "පවරපල්ල හෙවත් සූරියගවත්ත" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු තැන්පත් සී. බණ්ඩාරනායක විසින් මැන සාදන ලද අංක 1233 සහ 1956/02/10 වන දින දරන සැලැස්මේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති එම සම්පූර්ණ බිම් කොටස එහි පිහිටි ගොඩනැගිලි වැවිලි සහ සියල්ල සහිතවයි. එකී බිම් කැබැල්ලට මායිම් : උතුරට : මහවැව නමින් යුත් රජයේ ඉඩම, නැගෙනහිරට : මහවැව නමින් යුත් රජයේ ඉඩම සහ එන්. කේ. නායිදු විසින් මිල දී ගන්නා ලද ඉඩම, දකුණට : දොන් හෙන්ද්‍රික් තෙන්නකෝන් විදාන ආරච්චි සහ අනිකුත් අය හිමිකම් පාන ඉඩම සහ බස්නාහිරට : එන්. එස්. දොන් බස්තියන් විසින් මිල දී ගන්නා ලද ඉඩම සහ එහි ප්‍රමාණය රූඩ් එකයි පර්චස් තිස් පහක් (රූ. 1, පර්. 35) වේ. මෙය හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 57/97 හි ලියාපදිංචි කර ඇත.

මෑතක දී සාදන ලද මිනින්දෝරු සැලැස්මක ඉහත කී ඉඩම පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, නැගෙනහිර ගිරුවා පත්තුවේ මැදගම පිහිටි, "පවරපල්ල *හෙවත්* සූරියගහවත්ත" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු තැන්පත් ටී. කරුණාසිංහ විසින් මැන සාදන ලද අංක 0044 සහ 2012/10/03 වැනි දින දරන සැලැස්මේ නිරූපිත අංක 1 බිම් කැබැල්ල ලෙස ලකුණු කර ඇති බෙදා වෙන්කොට සීමා නිර්ණය කර තිබෙන එම බිම් කොටස, එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි සහ සියල්ල සහිතවයි. එකී අංක 1 බිම් කැබැල්ලට මායිම් : උතුරට : ප්‍රධාන පාරේ සිට නිවාස දක්වා වැටී ඇති පාර, නැගෙනහිරට : පාර (කලින් එන්. කේ. නායිදු හිමිකම් පෑ ඉඩම) සහ කේ. ඒ. සුනිල් හිමිකම් පාන ඉඩම (කලින් එන්. කේ. නායිදු හිමිකම් පෑ ඉඩම), දකුණට : දොන් තෙන්නකෝන් විදාන ආරච්චි සහ අනිකුත් අය හිමිකම් පාන ඉඩම සහ බස්නාහිරට : මුහන්දිරම්ගේ රත්නපාල හිමිකම් පාන ඉඩම (කලින් එන්. එස්. දොන් බස්තියන් හිමිකම් පෑ ඉඩම) සහ එහි ප්‍රමාණය රූඩ් එකයි පර්චස් තිස් දෙකයි දශම පහයි බින්දුවක් (රූ. 01, පර්. 32.50) වේ.

*ඉඩමට පිවිසීම.*- අම්බලන්තොට නගරයේ (ඔරලෝසු කණුව) සිට වලව පන්සල දක්වා තිස්ස පාර ඔස්සේ කිලෝමීටර් 1 ක පමණ දුරක් ගමන් කර (කොමර්ෂල් බැංකුව පසුකර මීටර් 400 ක් පමණ) අද්දරගොඩ පාර නමැති කොන්ක්‍රීට් කරන ලද පාරට දකුණට හැරී ඉන්පසු මීටර් 150 ක් පමණ ගමන් කළ විට විෂයගත දේපළ වෙත ළඟා විය හැක. විෂයගත දේපළ අද්දරගොඩ පාරට මායිම්ව දකුණු අත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීම් ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

(01) ගැණුම් මිලෙන් සියයට විසි පහක් (25%),
(02) නොතාරිස් ගාස්තු, ගමන් ගාස්තු සහ විකිණීමේ කොන්දේසි සකස් කිරීමේ ගාස්තුව රු. 10,500/-,
(03) සියළුම ප්‍රචාරක වියදම්,
(04) වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු (සිවිල් නීති සංග්‍රහයේ 258 වගන්තිය අනුව),
(05) ලිපිකරු, බෙරකරු හා සෝෂක ගාස්තු වශයෙන් රු. 4,500/= ,
(06) ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑ පහක (75%) මුදල දින 30 ක් ඇතුළත හම්බන්තොට දිසා අධිකරණයේ ඉහත නඩුවට තැන්පත් කළ යුතුය.

ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් විස්තර සඳහා පහත අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු හා උසාවි කොමසාරිස්,
වාණිජ මහාධිකරණය සහ කොළඹ දිසා අධිකරණයේ සහ
ගාල්ල දිසා අධිකරණයේ බලයලත් වෙන්දේසිකරු,
රාජ්‍ය හා වානිජ බැංකු,

අංක 7/1/10, 1 වන මහළ,
සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
බොරැල්ල, කොළඹ 08.
දුරකතන අංක : 011 2396520,

සමරරත්න ඇසෝසියේට්ස්,
නීතිඥවරු සහ නොතාරිස්වරු,
අංක 810, 2 වන මහළ,
මරදාන පාර, කොළඹ 10.
දුරකතන : 0112672262
0112672263
ෆැක්ස් : 0112683073

02 - 812

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි.

**පළමුවන උපලේඛනය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වෙල්ලබොඩ පත්තුවේ, බලපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ, බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශයේ, අංක 88B දරන රන්දොඹේ ග්‍රාම නිලධාරි වසමේ, රන්දොඹේ පිහිටි ගාලු පාරේ, වරිපනම් අංක 619 දරන, දික්වැල්ලේ වත්ත නමැති ඉඩමේ ලොට් 5 සහ 6 දරන ඒකාබද්ධ ඉඩම් කැබලිවලට බලයලත් මිනින්දෝරු ජී. ජී. එල්. පත්මසිරි විසින් මැන සාදන ලද අංක 168/2013 සහ 2013.10.15 දින දරන පිඹුරේ නිරූපිත ලොට් A වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටස

ප්‍රමාණය රූඩ් තුනකුත් පර්චස් විසිහයයි දශම හයක් (රූ.3, පර්. 26.6) විශාල ඉඩම් කැබැල්ල සහ එහි පස ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ වැවිලි පළතුරු ආදී සියලු දේත් සමග වන අතර, මෙම දේපළ බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 144/104 දරන වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

**දෙවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර දෙබැද්දේ, පානදුර ප්‍රාදේශීය සභා සීමාව තුළ, පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ, කෙසෙල්වත්ත, උපකාර්යාලයේ අංක 670 C දරන, හොරේතුඩුව ග්‍රාම නිලධාරී වසමේ, හොරේතුඩුවේ පිහිටි ගොරකගහවත්ත සහ නාගහදෙණිය නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ජී. ඩී. අර්සකුලරත්න විසින් මැන සාදන ලද අංක 1744 සහ 2012.09.03 දින දරන පිඹුරේ නිරූපිත ලොට් X වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටස ප්‍රමාණය පර්චස් දහතුනක් (පර්. 13) විශාල ඉඩම් කැබැල්ල සහ එහි පස ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 474/68 යටතේ ලියාපදිංචි කර ඇත.

**තුන්වන උපලේඛනය**

ලොට් ( A 1 සහ ලොට් A 2[1])

1. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තොට වලල්ලාවිට කෝරළයේ, ඇල්පිටිය ප්‍රාදේශීය සභා සීමාව තුල ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශයේ, අංක 27B දරන, බටහිර පිටුවල ග්‍රාම නිලධාරි වසමේ, පිටුවල ගමේ පිහිටි ලියන්ගහහේන නමැති ඉඩමේ ලොට් A දරන ඉඩම් කැබැල්ලේ ලොට් A3 දරන ඉඩම් කැබැල්ලට බලයලත් මිනින්දෝරු ජී. ජී. එල්. පත්මසිරි විසින් මැන සාදන ලද අංක 108A /2014 සහ 2014.07.07 දින දරන පිඹුරේ නිරූපිත ලොට් A1 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටස

ප්‍රමාණය අක්කර එකකුත් රූඩ් තුනයි පර්චස් විසිහයයි දශම එකක් (අ. 1, රූ. 3, පර්. 26.1) විශාල ඉඩම් කැබැල්ල සහ එහි පස ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ වැවිලි පළතුරු ආදී සෑම සියලු දේත් සමගය.

ඉහත කී ලොට් A 1 වනාහි මෙහි පහත සවිස්තරව දැක්වෙන ඉඩමේ නැවත මැන බෙදා වෙන් කිරීමක් වේ.

ඉහත කී පිටුවල ගමේ පිහිටි, ලියන්ගහහේන නමැති ඉඩමේ ලොට් A දරන ඉඩම් කැබැල්ලේ, ලොට් A3 දරන ඉඩම් කැබැල්ලට බලයලත් මිනින්දෝරු ජී. ජී. එල්. පත්මසිරි විසින් මැන සාදන ලද අංක 68 A/2012 සහ 2012.03.10 දින දරන පිඹුරේ නිරූපිත ලොට් A1 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටස ප්‍රමාණය අක්කර එකකුත් රූඩ් තුනයි පර්චස් විසිහයයි දශම එකක් (අ. 1, රූ. 3, පර්. 26.1) විශාල ඉඩම් කැබැල්ල සහ එහි පස ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ ඇල්පිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G16/133 දරන වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී පිටුවල ගමේ පිහිටි ලියන්ගහහේන නමැති ඉඩමේ ලොට් A දරන ඉඩම් කැබැල්ලේ, ලොට් A3 දරන ඉඩම් කැබැල්ලේ, ලොට් A 2 දරන ඉඩම් කැබැල්ලට බලයලත් මිනින්දෝරු ජී. ජී. එල්. පත්මසිරි විසින් මැන සාදන ලද අංක 108 A /2014 සහ 2014.07.07 දින දරන පිඹුරේ නිරූපිත ලොට් A2[1] වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටස

ප්‍රමාණය රූඩ් එකකුත් පර්චස් පහයි දශම හයයි (අ. 0, රූ. 1, පර්. 5.6) විශාල ඉඩම් කැබැල්ල සහ එහි පස, ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ ඇල්පිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 49/121 දරන වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

තවද, මෙහි පහත සවිස්තරව දැක්වෙන ඉඩම මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය සහ අනෙකුත් පරවශතා අයිතිවාසිකම් ද සමගය.

(3) ඉහත කී පිටුවල ගමේ පිහිටි ලියන්ගහහේන නමැති ඉඩමේ ලොට් A දරන ඉඩම් කැබැල්ලේ, ලොට් A 3 දරන ඉඩම් කැබැල්ලේ, ලොට් A2 දරන ඉඩම් කැබැල්ලට බලයලත් මිනින්දෝරු ජී. ජී. එල්. පත්මසිරි විසින් මැන සාදන ලද අංක 108 A/2014 සහ 2014.07.07 දින දරන පිඹුරේ නිරූපිත ලොට් A2[2] (අඩි 10ක් පළල පාර සඳහා

වෙන්කිරීම) වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටස ප්‍රමාණය පර්චස් එකයි දශම අටක් (පර්. 1.8) විශාල ඉඩම් කැබැල්ල. මෙම දේපළ ඇල්පිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 49/122 දරන වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

ඩී. ට්‍රෙඇංගල් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය බන්ධනදායි ලෙස ක්‍රියාකරමින් සහ උකස්කරු ලෙස ගුරුමුනි නිහාල් ආනන්ද ද සිල්වා යන අය (ඉහත කී ඩී. ට්‍රෙඇංගල් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ අධ්‍යක්ෂ සහ කොටස් හිමියා) විසින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මුදියන්සේලාගේ ඇන්ටනට් රෝමනි තලවත්ත සහතික කරන ලද අංක 669 සහ 2015.06.26 දින දරන උකස් බැඳුම්කරය, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මද්දුමගේ නිලූකා දිල්රුක්ෂි සහතික කරන ලද අංක 146 සහ 2017.12.18 දින දරන උකස් බැඳුම්කරය, ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කුළසේකර අබයරත්න අදිකාරම් මුදියන්සේ රාලහාමිලාගේ නේත්‍රරානි කුළසේකර සහතික කරන ලද අංක 1284 සහ 2019.05.29 දින දරන උකස් බැඳුම්කරය, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මද්දුමගේ නිලූකා දිල්රුක්ෂි සහතික කරන ලද අංක 774 සහ 2022.12.23 දින දරන උකස් බැඳුම්කරය, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මද්දුමගේ නිලූකා දිල්රුක්ෂි සහතික කරන ලද අංක 776 සහ 2022.12.23 දින දරන උකස් බැඳුම්කරය, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මද්දුමගේ නිලූකා දිල්රුක්ෂි සහතික කරන ලද අංක 778 සහ 2022.12.23 දින දරන උකස් බැඳුම්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මද්දුමගේ නිලූකා දිල්රුක්ෂි සහතික කරන ලද අංක 780 සහ 2022.12.23 දින දරන පරිශිෂ්ටය ලියා අත්සන් කොට තබා,

*සහ*

සිනමන් ලෙජන්ඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය බන්ධනදායි ලෙස ක්‍රියා කරමින් සහ උකස්කරු ලෙස ගුරුමුනි නිහාල් ආනන්ද ද සිල්වා යන අය (ඉහත කී සිනමන් ලෙජන්ඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ අධ්‍යක්ෂ සහ කොටස් හිමියා) විසින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. නදීකා ශ්‍යාමලී කුමාරි රාජපක්ෂ සහතික කරන ලද අංක 575 සහ 2016.11.02 දින දරන උකස් බැඳුම්කරය, ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කුළසේකර අබයරත්න අදිකාරම් මුදියන්සේ රාලහාමිලාගේ නේත්‍රරානි කුළසේකර විසින් සහතික කරන ලද අංක 1278 සහ 2019.05.29 දින දරන උකස් බැඳුම්කරය, ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කුළසේකර අබයරත්න අදිකාරම් මුදියන්සේ රාලහාමිලාගේ නේත්‍රරානි කුළසේකර විසින් සහතික කරන ලද අංක 1280 සහ 2019.05.29 දින දරන උකස් බැඳුම්කරය සහ ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කුළසේකර අබයරත්න අදිකාරම් මුදියන්සේ රාලහාමිලාගේ නේත්‍රරානි කුළසේකර විසින් සහතික කරන ලද අංක 1282 සහ 2019.05.29 දින දරන උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට තබා,

මෙහි පහත පළමුවන උපලේඛනයේ, දෙවන උපලේඛනයේ සහ තෙවන උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය, ඉහත කී ඩී. ට්‍රෙඇංගල් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සහ සිනමන් ලෙජන්ඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් ලබාගත් මුල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන්, කොළඹ 02, යුනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමින් උකස් කොට, ඇපයට තබා ඇති බැවින්ද,

එකී බැඳුම්කර මගින් ඇප තබන ලද ඉහත කී මූල්‍ය පහසුකම් ගෙවා පියවා දැමීම ඉහත කී ඩී. ට්‍රෙඇංගල් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සහ සිනමන් ලෙජන්ඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් පැහැර හැරීම කර ඇති බැවින්ද, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාරව,

පළමුවන උපලේඛනයේ දැක්වෙන දේපළ
ලොට් A **වර්ෂ 2024 ක් වූ මාර්තු මස 27 වැනි දින ප. ව. 1.30ට ද,**

දෙවන උපලේඛනයේ දැක්වෙන දේපළ,
**ලොට් X වර්ෂ 2024 ක් වූ මාර්තු මස 28 වැනි දින පෙ. ව. 10.00 ට ද,**

තුන්වන උපලේඛනයේ දැක්වෙන
ලොට් A 1 සහ ලොට් A2[1] **2024 ක් වූ මාර්තු මස 28 වැනි දින ප. ව. 02.00 ට ද,**

ඉහත සඳහන් දේපළ පිහිටි ස්ථානවල දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ වෙත පිවිසීම* :

පළමුවන උපලේඛනය ලොට් A (රූ. 3, පර්. 26.6) අම්බලන්ගොඩ කොළඹ පාර ඔස්සේ රංදොඹේ (84/1 බෝක්කුව) පසුකරනවාත් සමග විෂයගත ඉඩම මෙම පාරේ දකුණු අත පැත්තේ පිහිටා ඇත.

දෙවන උපලේඛනයේ ලොට් X (පර්. 13)

මොරටුව ඔරලෝසු කණුව හංදියේ සිට ගාලු පාර ඔස්සේ දිගරොල්ල පාලම දක්වා මීටර් 500 ක් පමණ ගමන් කර ඉන්පසු පාලම හරහා පානදුර පාරට වමට හැරී නාගහවරය පුරාණ විහාර පාර දක්වා මීටර 500 ක් පමණ පසුකර ඉන්පසු එකී පාරට වමට හැරී මීටර් 250ක් පමණ ගමන් කර නැවත එම පාරට වමට හැරී මීටර් 225ක් පමණ ගමන් කළ විට විෂයගත දේපල මෙම පාර අවසානයේ වම් අත පැත්තේ පිහිටා ඇත. (අඩි 10 පළල පාරේ අන්තිම මීටර් 100)

තුන්වන උපලේඛනය ලොට් A 1 (අ. 1, රූ. 3 පර්. 26.1) සහ ලොට් $A\ 2^1$ (අ. 0, රූ. 1, පර්. 5.6)

ඇල්පිටිය සිට පිටුවල පාර ඔස්සේ 4 වන හැතැප්ම කණුව හංදිය දක්වා කිලෝමීටර් 6ක් පමණ ගමන් කර ඉන්පසු කහදුව පාරට දකුණට හැරී මීටර් 650ක් පමණ ගමන් කළ විට දේපල මෙම පාරේ වම් අත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය* : විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුලත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. හි තැන්පත් කළ යුතුය.
03. පළාත් පාලන අය බදු සියයට එකයි (1%)
04. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%)
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%
06. ලිපිකරු හා සෝෂක වේතනය රු. 2000
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 8000

අනිකුත් තොරතුරු සඳහා පහත සඳහන් නිලධාරින්ගෙන් විමසන්න :

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ උසාවි කොමසාරිස්වරු,

අංක 7/1/10, 1 වන මහල,
සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
බොරැල්ල, කොළඹ 08.
දුරකතන : 011 2396520

නීති දෙපාර්තමේන්තුව,
නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී,
අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.
දුරකතන : 0114218746.

02 - 813

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීමයි

මෙම දේපළ "කැෂූ හවුස්" යන නාමය, විලාසය සහ අභිධානය යටතේ තනි හිමිකාරිත්වයක් සහිත ව්‍යාපාරයක් පවත්වාගෙන යන දොඹගහ පතිරණගේ මංජුල පීරිස් යන අය කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඉෂාරා දිලුමිණි වීරක්කොඩි විසින් සහතික කරන ලද අංක 1496 සහ 2010 ජූලි මස 08 දින දරන උකස් බැඳුම්කරය, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඉෂාරා දිලුමිණි වීරක්කොඩි විසින් සහතික කරන ලද අංක 1878 සහ 2011 ජූලි මස 05 දින දරන උකස් බැඳුම්කරය, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් නිරෝධා සුපේක්ෂලී කලන්සූරිය විසින් සහතික කරන ලද අංක 1444 සහ 2013 දෙසැම්බර් මස 05 දින දරන උකස් බැඳුම්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මද්දුමගේ නිලූකා දිල්රුක්ෂි විසින් සහතික කරන ලද අංක 174 සහ 2018 ජනවාරි මස 18 දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය, ඉහත කී දොඹගහ පතිරණගේ මංජුල පීරිස් යන අය විසින් ලබාගත් මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන්, බන්ධනදායි/ උකස්කරු ලෙස ක්‍රියාකරමින් ඉහත කී දොඹගහ පතිරණගේ මංජුල පීරිස් යන අය විසින් කොළඹ 02, යූනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමින් උකස්කොට, ඇපයට තබා ඇති බැවින් ද,

එකී බැඳුම්කරය මගින් ඇප තබන ලද ඉහත කී මූල්‍ය පහසුකම් ගෙවා පියවා දැමීම ඉහත කී දොඹගහ පතිරණගේ මංජුල පීරිස් යන අය විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහනගර සභා සීමාව තුළ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, අංක 16 දරන නාගරික කොට්ඨාසයේ, උතුරු හෝකන්දර ග්‍රාම නිලධාරී වසමේ, උතුරු හෝකන්දර ගමේ පිහිටි වානගුරු මාවතේ, 8 වන පටුමගේ, වරිපනම් අංක 37 දරන, කලුහෙට්ටියාවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. සමරනායක විසින් මැන සාදන ලද අංක 6767 සහ 1999 දෙසැම්බර් මස 08 දින දරන පිඹුරේ නිරූපිත ලොට් Q වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට, ලොට් P ද, නැගෙනහිරට : කුරුවිට ආරච්චි සහ තවත් අයගේ ඉඩම ද, දකුණට : ලොට් R ද, බස්නාහිරට : ලොට් R 2 (අඩි 20ක් පළල පාර සඳහා වෙන්කළ බිම් කොටස), ද යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 6767 දරන පිඹුර අනුව පර්චස් දහයකුත් දශම තුනක් (පර්. 10.3) විශාල ඉඩම් කැබැල්ල. මෙම දේපළ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 116/79 දරන වෙළුමේ/ පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

තවද, ඉහත කී ඉඩමට මෙහි පහත සවිස්තරව දක්වා ඇති පාර සඳහා වෙන් කළ බිම් කොටස් මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමගය.

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහනගර සභා සීමාව තුළ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, අංක 16 දරන නාගරික කොට්ඨාසයේ, උතුරු හෝකන්දර ග්‍රාම නිලධාරි වසමේ, උතුරු හෝකන්දර ගමේ පිහිටි කලුහෙට්ටියාවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. සමරනායක විසින් මැන සාදන ලද අංක 6767 සහ 1999 දෙසැම්බර් මස 08 දින දරන පිඹුරේ නිරූපිත ලොට් R1 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : කොස්කන්දවිල පාර ද, නැගෙනහිරට : ලොට් A, F, G, R4, H සහ K ද, දකුණට R2 (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කළ බිම් කොටස,) ද, බස්නාහිරට : අංක 6727 දරන පිඹුරේ නිරූපිත ලොට් D ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 6767 දරන පිඹුර අනුව පර්චස් විසි අටකුත් දශම හයක් (පර්.28.6) විශාල ඉඩම් කැබැල්ල වන අතර, මෙම දේපළ හෝමාගම ඉඩම් ලියාපදිංචි කරීමේ කාර්යාලයේ B 116/12 දරන වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහනගර සභා සීමාව තුළ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, අංක 16 දරන නාගරික කොට්ඨාසයේ, උතුරු හෝකන්දර ග්‍රාම නිලධාරි වසමේ, උතුරු හෝකන්දර ගමේ පිහිටි කලුහෙට්ටියාවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. සමරනායක විසින් මැන සාදන ලද අංක 6767 සහ 1999 දෙසැම්බර් මස 08 දින දරන පිඹුරේ නිරූපිත ලොට් R2 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : ලොට් R1 (අඩි 30ක් පළල පාර සඳහා වෙන්කළ බිම් කොටස) ද, නැගෙනහිරට : ලොට් L, M, N, O, P, Q සහ R6 ද, දකුණට : ලොට් R3 (අඩි 15ක් පළල පාර සඳහා වෙන්කළ බිම් කොටස) ද, බස්නාහිරට : අංක 6727 දරන පිඹුරේ නිරූපිත ලොට් D ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 6767 දරන පිඹුර අනුව පර්චස් දහනවයක් (පර්.19) විශාල ඉඩම් කැබැල්ල වන අතර, මෙම දේපළ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 116/63 දරන වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපළ,

**2024 මාර්තු මස 19 වැනි දින පස්වරු 2.00ට,**

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම .-* මාළඹේ නගරයේ සිට අතුරුගිරිය පාර ඔස්සේ කි.මී. 3ක පමණ දුරක් ගොස් කොස්කඳවල මංසන්ධිය දක්වා පැමිණ දකුණ පසට ඇති වානගුරු මාවතට හැරී තවත් මීටර් 400ක පමණ දුරක් ගොස් වම් පසට ඇති 8 වන පටුමගට හැරී මඳදුරක් ගියවිට අදාළ දේපළ මාර්ගයේ වම් පසින් මාර්ගයට යාබදව පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය .-* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1%ක (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්),
4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 7,500/-,
5. ලිපිකරුගේ හා සෝෂක වේතන රු. 2,500/-ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම්.
7. ගැණුම් මිලෙන් 90%ක ඉතිරියද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10%ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

*අනිකුත් තොරතුරු සඳහා විමසන්න :* කළමනාකරු නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී, නීති දෙපාර්තමේන්තුව, අංක 242, යුනියන් පෙදෙස. කොළඹ 02, දුරකතනය : 011 4218742.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

එම්. එච්. ටී. කරුණාරත්න (සාම විනිසුරු)
බලයලත් වෙන්දේසිකරු
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොළොන්නාව.
දුරකතන අංකය : 011 3068185/ 011 2572940.

02 - 786

---

**ඩීඑෆ්සීසී බැන්ක් පී.එල්.සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපළ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ඒ. ඩී. පී. උදයංගනී විසින් ලියා සහතික කරන ලද 2022.09.05 දිනැති අංක 110 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම, කොළඹ පදිංචි හේවා ගලමුලගේ උපුල් අජිත් කුමාර යන අය විසින් පැහැර හැර ඇති හෙයින්ද,

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහරගම නගර සභා බලසීමාව තුළ 529A දෙපානම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දෙපානම ගමේ පිහිටි, ඇටඹගහකනත්ත *හෙවත්*

ඇටඹගහලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර විසින් සාදන ලද 2015.05.29 දිනැති අංක 10288 දරන පිඹුරේ ලොට් X2 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 10288 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් හයක් (පර්චස් 06) *හෙවත්* හෙක්ටයාර 0.0152ක් විශාල ඉඩම එහි පිහිටි ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ සමග වේ.

පහත දැක්වෙන ඉඩම් මතින් හා ඔස්සේ වන මාර්ග අයිතිය ද සමග වේ.

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහරගම නගර සභා බලසීමාව තුළ 529A දෙපානම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දෙපානම ගමේ පිහිටි ඇටඹගහ කනත්ත *හෙවත්* ඇටඹගහලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක විසින් සාදන ලද 2011.07.06 දිනැති අංක 11503 දරන පිඹුරේ ලොට් A (අඩි 15ක් පළල පාරක් සඳහා වූ වෙන් කිරීම) වශයෙන් ලකුණුකොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 11503 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දහයක් (පර්චස් 10) *හෙවත්* හෙක්ටයාර 0.0253ක් විශාල ඉඩම එහි පිහිටි ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ සමග වේ. මෙය නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහරගම නගර සභා බලසීමාව තුළ 529A දෙපානම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දෙපානම ගමේ පිහිටි ඇටඹගහ කනත්ත *හෙවත්* ඇටඹගහලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක විසින් සාදන ලද 2011.07.06 දිනැති අංක 11503 දරන පිඹුරේ ලොට් 2 (හැරවුම් ස්ථානයක (turning circle) සඳහා වූ වෙන් කිරීම) වශයෙන් ලකුණුකොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 11503 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් එකයි දශම එකක් (පර්චස් 1.1) *හෙවත්* හෙක්ටයාර 0.0028ක් විශාල ඉඩම එහි පිහිටි ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ සමග වේ. මෙය නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහරගම නගර සභා බලසීමාව තුළ 529A දෙපානම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දෙපානම ගමේ පිහිටි ඇටඹගහ කනත්ත *හෙවත්* ඇටඹගහලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක විසින් සාදන ලද 2005.07.25 දිනැති අංක 9484 දරන පිඹුරේ ලොට් 12 වශයෙන් ලකුණුකොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 9484 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දහ හතයි දශම එකයි බිංදුවක් (පර්චස් 17.10) *හෙවත්* හෙක්ටයාර 0.0432ක් විශාල ඉඩම එහි පිහිටි ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ සමග වේ. මෙය නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

4. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහරගම නගර සභා බලසීමාව තුළ 529A දෙපානම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දෙපානම ගමේ පිහිටි ඇටඹගහ කනත්ත *හෙවත්* ඇටඹගහලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක විසින් සාදන ලද 2005.07.25 දිනැති අංක 9484 දරන පිඹුරේ ලොට් 16 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 9484 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම දෙකයි බිංදුවක් (පර්චස් 8.20) *හෙවත්* හෙක්ටයාර 0.0207ක් විශාල ඉඩම එහි පිහිටි ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ සමග වේ. මෙය නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපළ,

**2024 මාර්තු මස 19 වැනි දින පෙරවරු 11.30ට,**

එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම .-* මහරගම නගරයේ සිට හයිලෙවල් මාර්ගය ඔස්සේ කොට්ටාව දෙසට ගමන් කර වම්පසට ඇති බත්තරමුල්ල - පන්නිපිටිය (B 47) මාර්ගයට හැරී තවත් මීටර් 500 ක් පමණ ඉදිරියට ගොස් වම්පසට ඇති කැන්දහේනවත්ත පාරට හැරී තවත් මීටර් 130ක පමණ දුරක් ගිය විට හමුවන තුංමන් හන්දියෙන් වම්පසට හැරී තවත් මීටර් 120ක පමණ දුරක් ගිය විට අදාළ දේපළට පිවිසෙන අඩි 15ක් පමණ පළල ඇති මාර්ගය වම්පසින් හමුවේ.

*යෝජනා සම්මුති දැන්වීම .-* රජයේ *ගැසට්* පත්‍රයේ 2024.01.12 වන දින පළවී ඇති අතර දිවයින, ද අයිලන්ඩ් යන පුවත්පත්වල 2023.12.22 වන දින තිනකුරල් පුවත්පතේ 2023.12.28 වන දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය .-* සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලා වෙන්දේසිය අවසන් වූ වහාම වෙන්දේසිකරු වෙත පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැනුම් මිලෙන් 1%ක (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්),
4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3000/-,
5. ලිපිකරු හා සෝෂක වේතන රු. 2,000/-ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම්.
7. ගැණුම් මිලෙන් 90%ක ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

*වැඩි විස්තර සඳහා විමසන්න* : අයකර ගැනීම් සහ පුනරුත්ථාපන අංශය, ඩී එෆ් සී සී බැන්ක් පීඑල්සී, අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02, දුරකතන අංක : 011 2371371.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුය.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු)
බලයලත් වෙන්දේසිකරු
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොළොන්නාව.
දුරකතන අංක : 011 3068185, 011 2572940.

02 - 787

---

**ඩීඑෆ්සීසී බැන්ක් පී.එල්.සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපළ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ඩී. අයි. එන්. තිලකරත්න විසින් ලියා සහතික කරන ලද 2019.07.22 දිනැති අංක 774 සහ 2021.04.06 දිනැති අංක 866 දරන උකස් බැඳුම්කරයන් මත අයවිය යුතු ගෙවීම් කිරීම, අංගොඩ පදිංචි නිසල් චතුරංග ගෝවින්නගේ යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දකුණු අඹතලෙන් පහළ කොටිකාවත්ත, මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බලසීමාවේ, කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 513, ගොතටුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ගොතටුව පිහිටි නින්දගේන පාර, වරිපනම් අංක 7/3 දරන පිටමගුරේ කුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ විසින් සාදන ලද 2018.12.27 දිනැති අංක 15679 දරන මැනුම් පිඹුරේ ලොට් 1A වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 15679 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම හයයි පහක් (පර්. 6.65) *හෙවත්* හෙක්ටයාර 0.0168ක් විශාල ඉඩම එහි පිහිටි පස, ගහකොළ, ගොඩනැගිලි ඇතුලු අනෙකුත් සියලු දේ සමග වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දකුණු අඹතලෙන් පහළ කොටිකාවත්ත, මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බලසීමාවේ, කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 513, ගොතටුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ගොතටුව පිහිටි පිටමගුරේ කුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ විසින් සාදන ලද 1988.11.01 දිනැති අංක 540 දරන මැනුම් පිඹුරේ ලොට් 7 වශයෙන් ලකුණුකොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 540 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් නවයයි දශම දෙකයි බිංදුවක් (පර්.9.20) *හෙවත්* හෙක්ටයාර 0.01777 ක් විශාල ඉඩම වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ විසින් සාදන ලද 2018.12.27 දිනැති අංක 15679 දරන මැනුම් පිඹුරේ ලොට් 1B වශයෙන් ලකුණු කරන ලද ඇල ඔස්සේ වන වෙන් කිරීම ද සමග වේ.

ඉහත සඳහන් දේපළ,

**2024 මාර්තු මස 20 වැනි දින පස්වරු 1.30ට,**

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම .-* අංගොඩ I.D.H. මංසන්ධියේ සිට කොළොන්නාව පාර ඔස්සේ කි.මී. 1.2ක පමණ දුරක් ගොස් වම්පසට පිහිටි බෝගහ හන්දිය පාර දක්වා පැමිණ එම බෝගහ හන්දිය පාරට හැරී තවත් මීටර් 300ක පමණ දුරක් ඉදිරියට ගොස් නින්දගේන පාර දක්වා පැමිණ දකුණුපසට පිහිටි නින්දගේන පාරට හැරී තවත් මීටර් 30ක පමණ දුරක් ගොස් වම්පසට ඇති අඩි 10ක් පළල ඇති මාර්ගයට හැරෙන්න. එම මාර්ගයේ මීටර් 15ක පමණ දුරක් ගිය විට අංක 607/1 දරන අදාළ දේපළ මාර්ගයේ වම්පසින් පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම .-* රජයේ *ගැසට්* පත්‍රයේ 2024.01.05 වන දින පළවී ඇති අතර දිවයින, ද අයිලන්ඩ් යන පුවත්පත්වල 2023.12.22 වන දින ද, තිනකුරල් පුවත්පතේ 2023.12.28 වන දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය .-* සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලා වෙන්දේසිය අවසන් වූ වහාම වෙන්දේසිකරු වෙත පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1%ක (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්),
4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3000/-,
5. ලිපිකරු හා සෝෂක වේතන රු. 2,000/-ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම්.
7. ගැණුම් මිලෙන් 90%ක ඉතිරියද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

*වැඩි විස්තර සඳහා විමසන්න :* අයකර ගැනීම් සහ පුනරුත්ථාපන අංශය, ඩී එෆ් සී සී බැන්ක් පීඑල්සී, අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02, දුරකතන අංක : 011 2371371.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුය.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු)
බලයලත් වෙන්දේසිකරු
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොළොන්නාව.
දුරකතන අංක : 011 3068185, 011 2572940.

02 - 788

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.